# චිත්‍ර කලාව

පළමු වාරය

## අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල I,II

## 6 ශ්‍රේණිය








සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

චිත්‍ර කලාව - පළමු වාරය - අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල I,II (සි) - 6 ශ්‍රේණිය
சித்திரக் கலை - முதலாம் தவணை அத்தியாவசியக் கற்றல் மொடியூல்கள் I,II (சி) - தரம் 6
SC06EC1S -2026/319/114,400

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මගින් නැරඹිය හැකිය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e- Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

The National e-learning Portal for The General Education

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

නැණස TV | நெனச TV

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
Channel**NIE**
ජාතික අධ්‍යාපන ආයතනය
**தேசிய கல்வி நிறுவகம்**

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අපේ රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය
ලබන වසරේදීත් ඔබ සහෝදර සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න

පාසලේ නම : ..............................................................................................

| | පොත ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පන්ති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# චිත්‍ර කලාව

## පළමු වාරය

## අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල - I, II

## 6 - ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව



සියලුම මොඩියුල ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.nie.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**චිත්‍ර කලාව - 6 ශ්‍රේණිය**
අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුල - I, II
**පළමු වාරය :**

**මොඩියුලය** - I
**සැබෑ ලොව වර්ණ ගන්වමු**

**මොඩියුලය** - II
**දිවිය සරසන සිත් රූ නිමැවුම්**

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

**ISBN - 978-624-5729-88-3**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කුරුණෑගල, කොළඹ පාර, අංක 343 දරන ස්ථානයෙහි පිහිටි
චම්පිකා ප්‍රින්ටර්ස් ආයතනයෙහි
මුද්‍රණය කරවා බෙදාහරින ලදි.

Published by : National Institute of Education
Printed by : Champika Printers, 343, Colombo Rd, Kurunegala.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.
නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් මොඩියුල, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් මොඩියුල ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2025.07.21

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර් පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සැම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සැම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථා සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම් ආචාර්ය උපාලි සේදර, ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න හා මහාචාර්ය ප්‍රසාද් සේතුංග යන මහත්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

: ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : කේ. ජී. අජිත් රූපසේන - අධ්‍යක්ෂ
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**චිත්‍ර කලාව විෂය සම්බන්ධීකරණය** : රවීන්ද්‍ර තේනුවර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**මොඩියුලය I සම්බන්ධීකරණය** : ආචාර්ය චමරි තපස්වරගේ, කථිකාචාර්ය,
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**රචනය** :

රවීන්ද්‍ර තේනුවර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආචාර්ය චමරි තපස්වරගේ : කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර : අධ්‍යක්ෂ (සෞන්දර්ය විශ්‍රාමික), සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ප්‍රේමනාත් කොට්ටගේ : ගුරු සේවය, බෞද්ධාලෝක මහා විද්‍යාලය, පානදුර
දිප්ත ශ්‍රී උදයංග : ගුරු සේවය, මල්වත්තාවෙල ම.ම. විද්‍යාලය, වැල්ලවාය
එච්. එම්. එස්. පී. එච්. බණ්ඩාර : ගුරු සේවය, සාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර
යසිත රාජපක්ෂ : ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය, මිනුවන්ගොඩ

**මොඩියුලය II සම්බන්ධීකරණය** : රවීන්ද්‍ර තේනුවර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**රචනය** :

රවීන්ද්‍ර තේනුවර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
එම්. ජී. ඒ. කේ. යූ. බණ්ඩාර : අධ්‍යක්ෂ (සෞන්දර්ය-විශ්‍රාමික), සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ඥානසිරි බී. ගමගේ : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික), සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ඩබ්. පී. දීප්ති කුමාර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
එම්. එම්. බී. සමිත් ප්‍රදීප් ද සිල්වා : ගුරු සේවය, හද්දද්තාව ද්විතියික පාසල, මහියංගණය
එච්. එම්. එස්. පී. එච්. බණ්ඩාර : ගුරු සේවය, සාන්ත සිල්වෙස්තර විද්‍යාලය, මහනුවර
සමන් කුමාර විජේරත්න : ගුරු සේවය, බ/කන්දෙගෙදර ජාතික පාසල, බදුල්ල

**සංස්කරණය** :
**විෂය සංස්කරණය** : රවීන්ද්‍ර තේනුවර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්ය චමරි තපස්වරගේ, කථිකාචාර්ය

**භාෂා සංස්කරණය** : මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
ඩබ්. කරුණාරත්න, කළමනාකරු, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම
එච්. පී. සුසිල් සිරිසේන, උප පීඨාධිපති,
හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම

**මොඩියුලය I - පරිගණක පිටු සැකසුම** : ජේ. ඒ. යොමිත බිමල්, ග්‍රැෆික් නිර්මාණ ශිල්පී

**මොඩියුලය II - සන්නිදර්ශන චිත්‍ර, ඩිජිටල් රූප රචනය, පිටු සැකසුම සහ පිටකවර නිර්මාණය** : රවීන්ද්‍ර තේනුවර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**විවිධ සහාය** : ඊ. එල්. පෙරේරා, කළමනාකරණ සහකාර I
ආර්. එම්. ජී. යූ. රාජකරුණානායක, කළමනාකරණ සහකාර III
මාධවී පෙරේරා, කාර්යාල සහායක

# හැඳින්වීම

සෞන්දර්ය අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වන්නේ මිනිසාගේ වින්දන ක්ෂේත්‍රය පෝෂණය කිරීමයි. පුද්ගලයකුගේ ශ්‍රේෂ්ඨත්වය නිරූපණය කරනු වස් ලලිතකලා හදාරා තිබීම අවශ්‍ය අංගයක් බව අතීතයේ සිට පැවත එන කියමනකි. සූසැට කලාවන් ලෙස හඳුනාගෙන තිබුණේ මෙවැනි කලා වර්ගීකරණයට අයත් වූ කලා වේ. සෞන්දර්ය ක්ෂේත්‍රයේ වූ බොහෝ කලා අතුරින් චිත්‍ර, සංගීතය, නර්තනය සහ නාට්‍යය යන තෝරා ගත් විෂයයන් කිහිපයක් පමණක් පාසල් විෂයමාලාවට ඇතුළත් කර ඇත.

දාර්ශනික සිතිවිල්ලක් වූ සෞන්දර්ය පෙරදිග භාරතීය ඇදුරන්ගේ ප්‍රකට විෂයයක් විය. ඒ විග්‍රහ කිරීම් සඳහා නාට්‍ය ශාස්ත්‍රය ගුරු කොට ගත් අතර සෞන්දර්ය වූ කලී කලා කරුවාත්, රසිකයාත් අතුරින් වෙන් වූවක් නොව දෙදෙනා ම අතර ඇතිවන වින්දනමය තත්ත්වයක් ලෙස සැලකීම සාධාරණ ය. සෞන්දර්ය හදාරන්නා තුළ වින්දනය සියුම් ලෙස හා මටසිලිටි ලෙස පෝෂණය කළ යුතු අතර එමඟින් ජන සමාජයට හිතකර මානව භක්තිය හා දයාර්ද්‍ර හදවතක් බිහි කළ හැකි වේ. එමෙන් ම භාවමය තුළනය පිණිස මෙන් ම වින්දන ක්ෂේත්‍රයේ සංවර්ධනය පිණිස සෞන්දර්ය අධ්‍යාපනය ඉවහල් වේ. පංචේන්ද්‍රියන්ට ගෝචර ව අනුගත වන සෞන්දර්ය අධ්‍යාපනයේ අවසන් ඵලය සිත සමඟ සම්බන්ධ වන නිසා එය සෘජුව ම පුද්ගලයාගේ හදවතට බලපායි.

පුද්ගලයාගේ හැදියාව, ශිෂ්ටත්වය හා හදවත පෝෂණය මනුෂ්‍ය පෞරුෂයේ අංගයකි. බුද්ධියේ හා කෞශල්‍යයේ ඉහළ ම දියුණුවක් ලැබුව ද මනුෂ්‍ය භාවයේ පැවැත්ම හා එහි අලංකාරය මෙන් ම සාමකාමී සහජීවනය උදෙසා සෞන්දර්ය අවශ්‍ය වන අතර එමඟින් මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම වැඩිදියුණු කරයි. ජීවිතය වඩාත් අර්ථවත් කිරීම් වස් මනුෂ්‍යත්වය රෝපණය පිණිස සෞන්දර්ය අධ්‍යාපනය මහඟු පිටිවහලක් වේ.

පන්ති කාමරයේ සෞන්දර්ය විෂය ඉගෙන ගන්නා සිසු දරු දැරියන් වෙනුවෙන් මුද්‍රිත මොඩියුල ලැබෙන්නේ ප්‍රථම වරට ය. විචිත්‍ර ලෙස හා ආකර්ෂණීය ව සකස් කර ඇති මෙම අත්‍යවශ්‍ය සෞන්දර්ය මොඩියුල වාරයකට දෙක බැගින් එක් ශ්‍රේණියක් සඳහා මොඩියුල හයක් නිර්දේශිත ය. 21 වන සියවසට අවශ්‍ය නිපුණතා ලබා ගැනීමට හැකි වන සේ සිසු දරු දැරියන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන මෙම මොඩියුලවල ඇති සියලු ක්‍රියාකරකම් සකස් කර ඇත.

**කේ. ජී. අජිත් රූපසේන**
අධ්‍යක්ෂ
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යපන ආයතනය

# පටුන

## මොඩියුලය - I සැබෑ ලොව වර්ණ ගන්වමු


| | පිටු |
|---|---|
| හැඳින්වීම | 1-2 |
| පූර්ව පරීක්ෂාව | 3 |
| ක්‍රියාකාරකම් | |
| 01. පාසල් වත්ත සිත්තම් කරමු | 4-9 |
| 02. උඩුකය රූප සිතුවම් කරමු | 10-13 |
| 03. මූලික ජ්‍යාමිතික හැඩ ඇඳ, වර්ණ ගන්වමු | 14-23 |
| 04. මිනිස් රූප අඳිමු | 24-29 |
| 05. සත්ත්ව රූප අඳිමු | 30-35 |
| 06. සිද්ධාන්ත ඉගෙන ගනිමු | 37-42 |


## මොඩියුලය - II දිවිය සරසන සිත්රූ නිමැවුම්


| | පිටු |
|---|---|
| හැඳින්වීම | 44-45 |
| පූර්ව පරීක්ෂාව | 46 |
| ක්‍රියාකාරකම් | |
| 01. ව්‍යාජ්ත සැරසිල්ලක් නිර්මාණය කරමු | 47-55 |
| 02. ළමා පොතකට නමක් අඳිමු | 56-62 |
| 03. සුබ පැතුම් පතක් නිමවමු | 63-69 |
| 04. මිනිස් රුවක් සරල ව අඹමු | 70-76 |
| 05. සත්ත්ව රුවක් සරල ව අඹමු | 77-84 |

# චිත්‍ර කලාව

පළමු වාරය

අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුලය - I

**6 ශ්‍රේණිය**

## සැබෑ ලොව වර්ණ ගන්වමු



# මොඩියුලය 1 - හැඳින්වීම

මෙම මොඩියුලයෙන් විවිධ නිර්මාණ අත්දැකීම් ලබා ගැනීමට ඔබට හැකි වේ. එහි දී ගවේෂණාත්මක ව නිර්මාණශීලී ක්‍රියාකාරකම් කිරීමට ඔබට අවස්ථාව සම්පාදනය කර ඇත. ඒ සඳහා විවිධ ද්‍රව්‍ය, මාධ්‍ය සහ ශිල්ප ක්‍රම පිළිබඳ අත්හදා බැලීම් සහිත ඉගෙනුම් ක්‍රියාකාරකම් මෙහි ඇතුළත් වෙයි. මෙම නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් 21 වන සියවසට අදාළ චින්තන, සමාජ හා පෞද්ගලික කුසලතා සංවර්ධනය කර ගැනීමට හැකි වේ. ඉගෙනුම් ක්‍රියාවලිය අතරතුර අනාගත වෘත්තීය අවස්ථාවන්ට උචිත කුසලතා ලබා දෙන අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ද සිදු කෙරේ.




## මොඩියුලය - I මගින් ආවරණය කෙරෙන ඉගෙනුම් පල

- පාසල් පරිසරය ඇසුරෙන් භූමි දර්ශන සිතුවම් නිර්මාණය කරයි.
- ඡායාරූප ඇසුරෙන් උඩුකය රූප අඳියි.
- මූලික ජ්‍යාමිතික වස්තු ත්‍රිමාන ව අඳියි.
- නිවැරදි ප්‍රමාණ, මූලික හා සරල ජ්‍යාමිතික හැඩ ඇසුරින් මානව රූප අඳියි.
- මූලික හා සරල ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් සත්ත්ව රූප අඳියි.
- චිත්‍ර කලා මූලිකාංග හා මූලධර්ම ප්‍රායෝගික ව අත්හදා බලයි.




## මොඩියුලය භාවිතයට උපදෙස්

මෙම මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම් ඔබ හොඳින් කියවන්න. දී ඇති උපදෙස් හොඳින් පිළිපදින්න. ඔබගේ ගුරුතුමා / ගුරුතුමියගේ මග පෙන්වීම් අනුව සාමූහික ව සහ තනි තනි ව පන්ති කාමරයේ දී මෙන් ම ඉන් බැහැරවත් සතුටින් ක්‍රියාකාරකම්වල නිරත වීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. මොඩියුලයෙහි ඇතුළත් ක්‍රියාකාරකම් පරිශීලනය කිරීම සඳහා ආදර්ශයක් පහතින් දැක් වේ.



## පූර්ව පරීක්ෂාව

පහත දක්වා ඇති කුසලතා සම්බන්ධ ව ඔබගේ පෙර දැනුම පරීක්ෂා කර ගන්න.

| කුසලතා | ඉතා හොඳින් පුළුවන් | හොඳින් පුළුවන් | තරමක් පුළුවන් |
|---|---|---|---|
| 1. භූමි දර්ශන සිතුවම් නිර්මාණය කිරීමට | | | |
| 2. උඩුකය රූප ඇඳීමට | | | |
| 3. මූලික ජ්‍යාමිතික වස්තු ත්‍රිමාන ව ඇඳීමට | | | |
| 4. නිවැරදි සරල ජ්‍යාමිතික හැඩ සහිත ව මානව රූප ඇඳීමට | | | |
| 5. සරල ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් සත්ත්ව රූප ඇඳීමට | | | |
| 6. චිත්‍ර කලා මූලිකාංග හා මූලධර්ම ප්‍රායෝගික ව අත්හදා බැලීමට | | | |

**මෙම මොඩියුලය ඔබට පමණක් නො වේ.**
**ඔබේ පහළ ශ්‍රේණිවල සොයුරු සොයුරියන් වෙනුවෙන් ද සුරකින්න.**

# 01

කාලච්ඡේද 02යි

# පාසල් වත්ත සිත්තම් කරමු



**ඔබේ පාසල් පරිසරය ඉතා සුන්දර මනරම් නෙත රඳවන ස්ථානයක් විය හැකි ය. එම පරිසරයේ පෙනෙන වර්ණ, රේඛා, හැඩ නිරීක්ෂණයෙන් පරිසරයේ සුන්දරත්වය හා විවිධත්වය සිත්තම් කරමු.**

**මෙම ක්‍රියාකාරකම මගින්**

- පරිසරයේ දක්නට ඇති ස්වාභාවික හා නිර්මිත හැඩ නිවැරදි ව වර්ග කිරීම
- තෝරා ගත් පරිසරය සාර්ථක ව ඇඳීම
- දුර-ළඟ අනුව රූප නිවැරදි ව ඇඳීම
- සාර්ථක ව වර්ණ භාවිත කිරීම
- පිළිවෙළට හා නිර්මාණශීලී ව ක්‍රියා කිරීම,

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

**අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පැන්සල් (HB,2B)
- පැස්ටල් / දියසායම්
- පින්සලයක්
- බ්‍රිස්ල් බෝර්ඩ් 11" x 8" ප්‍රමාණයේ කොටසක්
- පේපර් කටර් 01
- අඩි කෝදුවක්

## පෙර සූදානම

- පහත දැක්වෙන කඩදාසි කවුළුව සකස් කර ගෙන පැමිණෙන්න. අඟල් 11 x 8 ප්‍රමාණයේ බ්‍රිස්ල් බෝර්ඩ් කොටසක මැදින් අඟල් 06 x 04 ප්‍රමාණයේ කොටසක් කපා ඉවත් කරන්න.
- මේ සඳහා ඔබට වැඩිහිටියකුගෙන් සහාය ලබා ගැනීමට හැකි ය.




## පියවර - 1

- දුවේ, පුතේ, පාසල් පරිසරය ඇඳීම සඳහා පාසල් වත්ත හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබගේ යහළුවන් සමග එකතු වී පාසලේ දැකිය හැකි ස්වාභාවික හා නිර්මිත වස්තූන් පිළිබඳ සාකච්ඡා කරමින් ඔබගේ පොතේ තොරතුරු ඇතුළත් කර ගන්න.

| ස්වාභාවික වස්තු | නිර්මිත වස්තු |
|---|---|
| ............................................... | ............................................... |
| ............................................... | ............................................... |
| ............................................... | ............................................... |

**ඉඟිය - 01**

<u>**ස්වාභාවික වස්තු**</u>

පරිසරයේ ඇති ගස්වැල්, සතුන්, මිනිසුන්, දියඇලි, ගංගා, කඳු ආදිය මෙයට අයත් වේ.

<u>**නිර්මිත වස්තු**</u>

මිනිසුන් විසින් නිර්මාණය කර ඇති ගොඩනැගිලි, පාර, පිට්ටනි, පඩිපෙළ වැනි දේවල් මෙයට අයත් වේ.

## පියවර - 2

- ගුරුතුමා හෝ ගුරුතුමියගේ උපදෙස් මත පාසල් පරිසරයේ තෝරා ගත් ස්ථානයක් ඇඳීමට සූදානම් වෙමු.
- ඒ සඳහා ඔබ විසින් සූදානම් කරන ලද කඩදාසි කවුළුව භාවිතයෙන් පාසල් පරිසරයේ ඇඳීමට සුදුසු දර්ශනයක් තෝරා ගන්න.
- කවුළුව ආධාරයෙන් ඔබ දකින දර්ශනයේ
  - දුර හා ළඟ වස්තූන්වල ස්වභාවය
  - ඒ අනුව වස්තූන්ගේ ප්‍රමාණ වෙනස් වීම නිරීක්ෂණය කරන්න.



- තෝරාගත් දර්ශනය ඇඳීම සඳහා පළමු ව දුර හා ළඟ දැක්වීම සඳහා කඩදාසිය පහත පරිදි කොටස්/ තීරු තුනකට බෙදා ගන්න.






- මුල් ම තීරුව වන පෙරබිමේ අඳින රූප විශාලවත්, දෙවන තීරුව වන මැදබිම තුළ අඳින රූප කුඩාවටත්, තුන්වන තීරුව වන පසුබිම මත ඉතා කුඩාවටත් රූප ඇඳීමට යොමු වන්න.

## පියවර - 3

- රේඛා මඟින් ඇඳ ගනු ලැබූ පාසල් පරිසරය වර්ණ ගැන්වීමට යොමු වෙමු.
- තෝරා ගත් පරිසරයේ දැකිය හැකි වර්ණ ඒ ආකාරයෙන් ම යෙදීම හා දුර-ළඟ වෙනස දැක්වීම සඳහා වර්ණ ප්‍රභේද භාවිත කිරීමට සැලකිලිමත් වන්න.
- ඒ සඳහා පහත දැක්වෙන නිදර්ශන භාවිතයට ගන්න.









වර්ණ ගැන්වීමේ දී දුර-ළඟ සඳහා වර්ණ ප්‍රභේද භාවිත කිරීම



## පියවර - 4

- ඔබගේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| ස්වාභාවික හා නිර්මිත වස්තු නිවැරදි ව වර්ග කිරීමට | | | | |
| තෝරා ගත් දර්ශනය සාර්ථක ව ඇඳීමට | | | | |
| නිවැරදි ව දුර ළඟ හා ප්‍රමාණ දැක්වීමට | | | | |
| සාර්ථක ව වර්ණ භාවිත කිරීමට | | | | |
| යම් කාර්යයක් පිළිවෙළට හා නිර්මාණශීලී ව කිරීමට | | | | |

- තක්සේරුව අවසානයේ ඔබගේ හැකියා තවදුරටත් සංවර්ධනය කර ගැනීමට ඉගෙනුම් අභ්‍යාස (පසු වැඩ) කිරීමට උනන්දු වන්න.

**ජීවිතයට යමක්**

දුවේ, පුතේ, ඔබේ පාසල් වත්ත සුන්දර හා ප්‍රියමනාප ස්ථානයක් බවට පත් කර ගැනීම ඔබගේ යුතුකමකි. එසේ ම, පාසල් වත්ත පිරිසුදු ස්ථානයක් බවට පත් කර ගැනීම ඔබගේ ප්‍රධාන වගකීමක් වේ. ඒ සඳහා හැමවිට ම පරිසර හිතකාමී ව කටයුතු කරන්න.

## පසු වැඩ

පහත දැක්වෙන ලෙස ඔබගේ නිර්මාණයට සුදුසු රාමුවක් සකසා නිවසේ ප්‍රදර්ශනයට උචිත නිමි කෘතියක් බවට සුදානම් කර ගන්න.





# 02 උඩුකය රූප සිතුවම් කරමු

කාලච්ඡේද 01යි

**දුවේ, පුතේ, අපි අද උඩුකය රූපයක් සිතුවම් කරමු.**

**උඩුකය රූපයක් කියන්නේ මිනිස් මුහුණක ප්‍රධාන කොටස් වන ඇස්, නාසය, කට, කොණ්ඩය, බෙල්ල හා උරහිස් දක්වන රූපයක්**





**මෙම ක්‍රියාකාරකම මගින්**

- මුහුණක හැඩ හා කොටස් සාර්ථක ව සලකුණු කිරීම
- මුහුණේ අංග ලක්ෂණ නිවැරදි ව ඇඳීම
- සාර්ථක ව වර්ණ භාවිත කිරීම
- නව්‍යතාවයෙන් යුතු ව නිර්මාණ කිරීම
- සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීම

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

**අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ**

- චිත්‍ර ඇඳීමේ කඩදාසි
- පුවත්පත් සඟරා හා දින දර්ශනවල දක්නට ලැබෙන උඩුකය රූපයක පින්තූරයක් හෝ ඡායාරූපයක්
- ගම්
- පැස්ටල්
- පැන්සල්

## පෙර සූදානම

දුවේ, පුතේ, මෙම ක්‍රියාකාරකම කිරීමට පුවත්පත්, සඟරා හා දින දර්ශනවල දක්නට ලැබෙන උඩුකය රූපයක පින්තූරයක් හෝ ඡායාරූපයක් රැගෙන එන්න. මෙම රූපය අවම වශයෙන් A4 භාගයක ප්‍රමාණයේ විය යුතු ය. ඒ සමග ම මෙම නිර්මාණයට අවශ්‍ය කඩදාසි, තෝරා ගත් වර්ණ මාධ්‍යය හා ඇලවීමට ගම් ආදිය ද සූදානම් කර ගන්න.

## පියවර - 1



- ඔබ ගෙන එන ලද හා මොඩියුලයේ ඉදිරිපත් කර ඇති නිර්මාණය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම නිරීක්ෂණ ඇසුරින් උඩුකය රූපයක දක්නට ඇති කොටස් හා අංග පිළිබඳ ව ඔබේ මිතුරන් සමග සාකච්ඡා කරන්න.

## පියවර - 2



- ඉහත කරුණු අනුව ඔබ සපයා ගත් ඡායාරූපය/පින්තූරය හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම පින්තූරය හෝ ඡායාරූපය ඔබගේ චිත්‍ර ඇඳින කඩදාසියේ අලවා ගන්න.
- අලවා ගන්නා ලද රූපය මත, මුහුණේ හැඩය, එහි ඇස, නාසය, කට සහ අනෙකුත් අංග පැන්සල් රේඛාවෙන් සටහන් කර ගන්න. ඒ සඳහා පහත දක්වා ඇති ආදර්ශ ඇසුරු කර ගන්න.

## පියවර - 3

- ඡායාරූපය මත ඇඳීමෙන් ඔබ ලද හුරුව අනුව නැවත එම රූපය වෙනත් චිත්‍ර ඇඳින කොළයක පැන්සල් රේඛාවෙන් සටහන් කර ගන්න.
- ඒ සඳහා පහත නිදර්ශන ආදර්ශයට ගන්න.





## පියවර - 4



- ඔබ ඇඳ ගත් රේඛා සටහන වර්ණ ගන්වන්න. එහි දී ඔබ තෝරා ගත් ඡායාරූපයේ දැක්වෙන වර්ණ ඒ ආකාරයට ම භාවිත කිරීමට සැලකිලිමත් වන්න.
- ඒ සඳහා හමේ වර්ණය හිස කෙස් (කොණ්ඩය) හා ඇඳුම සඳහා යොදා ඇති වර්ණ ඒ ආකාරයෙන් ම යෙදීමට උත්සාහ කරන්න.





## පියවර - 5

- ඔබගේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරින් ඔබේ හැකියා පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| මුහුණේ හැඩ හා කොටස් සාර්ථක ව සලකුණු කිරීමට | | | | |
| මුහුණේ හැඩ හා අංග නිවැරදි ව ඇඳීමට | | | | |
| සාර්ථකව වර්ණ මාධ්‍යය භාවිත කිරීමට | | | | |
| නව්‍යතාවයෙන් නිර්මාණ කිරීමට | | | | |
| සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීමට | | | | |

- ඔබගේ හැකියා තවදුරටත් සංවර්ධනය කර ගැනීමට ඉගෙනුම් අභ්‍යාස කිරීමට උනන්දු වන්න.

## පසු වැඩ

**01.** පහත දැක්වෙන පරිදි ඔබගේ නිර්මාණයට සුදුසු රාමුවක් යොදා නිවසේ ප්‍රදර්ශනයට උචිත නිමි කෘතියක් ලෙස සුදානම් කර ගන්න.



**02.**

- **ඔබ අඳින ලද ඡායාරූපය ඇසුරෙන් වෙනත් ආකාරයක උඩුකය රුවක් අඳිමු.**
- ඡායාරූපය චිත්‍ර අඳින කඩදාසියේ පැන්සල් රේඛාවෙන් නැවත ඇඳ ගන්න. **ඡායාරූපයේ දැකිය හැකි වර්ණ රටාවෙන් වෙනස් ව** කැමති ලෙස අඳින ලද රූපය වර්ණ ගැන්වීම කරන්න.
- රූපය ඉස්මතු වන ලෙස හා ඊට ගැළපෙන නිර්මාණාත්මක පසුබිමක් යොදා චිත්‍රය නිම කර ගන්න.



# 03

කාලච්ඡේද 02යි



# මූලික ජ්‍යාමිතික වස්තු ඇඳ වර්ණ ගන්වමු

**පරිසරයේ ඇති සෑම වස්තුවක ම මූලික හැඩ නිර්මාණය වී ඇත්තේ ගෝලය, සිලින්ඩරය, ඝනකය, කේතුව වැනි හැඩවලින් බව හඳුනාගත හැකි ය. චිත්‍ර ඇඳීමේ හුරුව ලැබීමට අපි එම ජ්‍යාමිතික හැඩ ඉගෙන ගනිමු.**

**අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ**

- පැන්සල් (2B, 4 B, 6 B,)
- පැස්ටල්
- චිත්‍ර අඳින කඩදාසි
- අඩිරූල
- බෝලයක්/කුඩා බෙරයක් හෝ ටින් එකක් / දාදු කැටයක්

**මෙම ක්‍රියාකාරකම මගින්**

- ගෝලය, සිලින්ඩරය, ඝනකය ඇඳීම සඳහා සරල ආකෘති භාවිත කිරීම
- පරිමාණානුකූල ව ගෝලය, සිලින්ඩරය, ඝනකය නිවැරදි ව ඇඳීම
- රේඛා ඇසුරෙන් ගෝලය, සිලින්ඩරය සහ ඝනකයෙහි ත්‍රිමානත්වය මතු කිරීම
- වර්ණ මාධ්‍ය භාවිතයෙන් ගෝලය, සිලින්ඩරය, ඝනකය ත්‍රිමාන ව ඇඳීම
- සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළට කාර්ය කිරීම

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

## පියවර - 1

■ ඔබ රැගෙන ආ බෝලය, ටින් එක හා දාදු කැටය ගෙන ඒවායේ මූලික හැඩ ලෙස ගෝලය, සිලින්ඩරය, ඝනකය හඳුනා ගන්න. එම හැඩවලට සමාන ඔබ දන්නා වෙනත් භාණ්ඩ පිළිබඳ මිතුරන් සමග සාකච්ඡා කරන්න.

■ පහත වගුවට අදාළ තොරතුරු ඔබේ චිත්‍ර පොතෙහි සටහන් කර ගන්න.

| භාණ්ඩය | මූලික හැඩය | මූලික හැඩවල ලක්ෂණ | වෙනත් සමාන හැඩ |
|---|---|---|---|
| බෝලය | | | |
| ටින් එක | | | |
| දාදු කැටය | | | |

**ඉඟිය 01** ගෝලය, සිලින්ඩරය සහ ඝනකය මූලික හැඩ වේ. ඒවා ජ්‍යාමිතික ආකෘති ලෙස ද හැඳින්වේ.



## පියවර - 2 වෘත්තයක් ඇඳ වර්ණ ගන්වමු

**1. පහත දැක්වෙන පියවර ඔස්සේ වෘත්තයක් අඳිමු.**



1. සමචතුරස්‍රයක් අඳින්න.
2. එම සමචතුරස්‍රය සමාන කොටස් 8කට බෙදන්න.
3. එහි සමාන දුර සලකුණු කරන්න.
4. එම සලකුණු යා කර වෘත්තය අඳින්න.

**2. සමචතුරස්‍රයක් ඇඳ ඒ තුළ වෘත්තයක් අඳිමු.**



**3. නිදහස් අතින් වෘත්තය ඇඳීමට හුරු වෙමු.**



■ අඛණ්ඩ ව රේඛාව ගමන් කරන සේ පැන්සල ගෙන අතින් නිවැරදි ව වෘත්තය ඇඳීමට උත්සාහ කරන්න.

■ එකවර නිවැරදි ව නිදහස් අතින් වෘත්තය ඇඳීමට හුරු වන්න.

## නිරීක්ෂණයෙන් හඳුනා ගනිමු

■ ඔබ ඉදිරියේ තබා ඇති ගෝලය හොඳින් නිරීක්ෂණය කර පහත රූපයේ දැක්වෙන පරිදි එහි ලක්ෂණ හඳුනා ගන්න.






**ඉඟිය - 02**

යම් වස්තුවකට එළිය වැටෙන පැත්තට විරුද්ධ පැත්ත අඳුරු වේ. අඳුර-එළිය අතර වෙනස නිසා වස්තුවක ඝනත්වය මතු වේ. අඳුර එළිය දක්වමින් ඝනත්වය මතු කිරීම ත්‍රිමාන ලක්ෂණ දැක්වීම වේ.

## පැන්සලෙන් ගෝලය ඇඳ අඳුර - එළිය දක්වමු

■ ඔබ ඉදිරියේ තබා ඇති ගෝලය හොඳින් නිරීක්ෂණය කරන්න. එය පැන්සලෙන් ඇඳ පහත පියවර ඔස්සේ පැන්සල් රේඛාවෙන් අඳුර-එළිය දක්වන්න.

■ අඳුර එළිය දැක්වීමට පැන්සල් රේඛාවේ විවිධත්වය භාවිත කරන්න.



1 වෘත්තයක් අඳින්න.

2 අඳුරේ වෙනස සලකුණු කරන්න.

3 තද පැහැති රේඛාවෙන් අඳුර දක්වන්න.

4 අඳුරේ අඩු වීම පැන්සල් රේඛාවේ පැහැය අඩු කරමින් දක්වන්න.

**ඉඟිය - 03**

රේඛාවේ විවිධත්වය භාවිත කර අඳුර-එළිය අතර වෙනස දැක්විය හැකි ය. මේ සඳහා එක ම පැන්සලේ තද හා ළා පැහැය භාවිත කළ හැකි ය. නැතහොත් ඒ සඳහා විවිධ වර්ණ ශක්ති සහිත පැන්සල් කිහිපයක් භාවිත කළ හැකි ය.

- වර්ණ ශක්ති හෙවත් වර්ණ අගය යනු පැහැයේ වෙනස වේ.
- තද පැහැයේ සිට ළා පැහැය දක්වා විවිධ අවස්ථා ඇත.
- මෙය වර්ණයක ප්‍රභේද ලෙස හැඳින්වේ.




## ගෝලය ඇඳ වර්ණ ගන්වමු

- ඔබ ඉදිරියේ ඇති ගෝලය හොඳින් නිරීක්ෂණය කරමින් එය ඇඳ, පැස්ටල් මාධ්‍යයෙන් වර්ණ ගන්වන්න.
- එක් වර්ණයක ප්‍රභේද පමණක් භාවිත කරන්න.
- ළා පැහැය දැක්වීමට තෝරා ගත් වර්ණය සමග සුදු පැහැය මිශ්‍ර කළ හැකි ය. ඒ සඳහා පහත නිදර්ශන භාවිතයට ගන්න.
- වර්ණ මිශ්‍ර කිරීම සඳහා පැස්ටල් කැබැල්ල හරස් අතට භාවිත කරන්න. ඒ සඳහා පහත නිදර්ශන ආදර්ශයට ගන්න.

**නිදර්ශන 1 : එක් වර්ණයක් භාවිත කිරීම**



ගෝලය අඳින්න.

අඳුර සලකුණු කරන්න.

අඳුර-එළිය මතු වන සේ පැස්ටල් භාවිත කර වර්ණ ගන්වන්න.

**නිදර්ශන 2 : වර්ණ කිහිපයක් භාවිත කිරීම**



ගෝලය ඇඳින්න.

අඳුර සලකුණු කරන්න.

අඳුර-එළිය මතු වන සේ පැස්ටල් භාවිත කර වර්ණ කරන්න.

ඉඟිය - 04

පැස්ටල් වියළි ඝන මාධ්‍යයකි.
පහසුවෙන් පරිහරණය කළ හැකි ය.
විවිධ ශිල්ප ක්‍රම තිබේ.





තද පැහැය මුලින් යොදා ළා පැහැය මිශ්‍ර කිරීම පහසු ය. එක මත එක වර්ණ යොදා පැහැය වෙනස් කිරීම පහසු ය.

## පියවර - 3 සිලින්ඩරය ඇඳ වර්ණ ගන්වමු

**1. පහත දැක්වෙන පියවර ඔස්සේ සිලින්ඩරය අඳිමු**



1. සිරස් අතට සෘජුකෝණාස්‍රයක් අඳින්න.
2. එම සෘජුකෝණාස්‍රය මත ඉහළින් හා පහළින් සමාන කොටස් දෙකක් වෙන් කරන්න.
3. වෙන් කළ කොටස් සමාන ව බෙදන්න.

4. බෙදූ කොටස්වල ඉලිප්සාකාර හැඩතලය අඳින්න.



5. සිලින්ඩරාකාර හැඩතලය මතු කරන්න.



## 2. නිදහස් අතින් ආධාරයකින් තොර ව සිලින්ඩරය ඇඳීමට හුරු වෙමු



**ඉඟිය - 05**

වස්තුවක් නිවැරදි ව ඇඳීමට පරිමාණ ලක්ෂණ භාවිත කළ යුතුයි.

සිලින්ඩරයේ පළල මෙන් උස කොපමණ වේ ද යන්න හඳුනා ගැනීමෙන් එය පරිමාණානුකූල ව නිවැරදි ව ඇඳීමට හැකි ය.



ඔබ ඉදිරියේ ඇති සිලින්ඩරයේ ලක්ෂණ හඳුනා ගෙන පැන්සල් රේඛාවෙන් අඳුර - එළිය දක්වන්න.






1. සිලින්ඩරය රේඛා වෙන් ඇඳ ගන්න.
2. එහි රවුම් බව සමග එළිය-අඳුර සලකුණු කරන්න.
3. පැන්සල් රේඛා භාවිතයෙන් අඳුර-එළිය දක්වන්න.

සිලින්ඩරය ඇඳ වර්ණ කරන්න.



සිලින්ඩරය අඳින්න. අඳුර සලකුණු කරන්න. පැස්ටල් වර්ණ යොදන්න.

## පියවර - 4 ඝනකයක් ඇඳ වර්ණ ගන්වමු

**1. ලක්ෂ යා කරමින් ඝනකයක් ඇඳීමට හුරු වෙමු.**




■ අඩිරූල භාවිත කර පහත සඳහන් පිළිවෙළට ඉහත ලක්ෂ්‍ය යා කරන්න.

| | | |
|---|---|---|
| 1. A → B | 2. C → D | 3. A → D |
| 4. A → E | 5. B → D | 6. B → E |
| 7. F → G | 8. H → I | 9. A → H |
| 10. B → F | | |

- *D,G,F,J,H,I,E* ලක්ෂ්‍ය අතර ඝනකයක් නිර්මාණය වී ඇති ආකාරය හඳුනා ගන්න.

- D සිට A දක්වාත්, E සිට A දක්වාත්, H සිට A දක්වාත් මෙන් ම D සිට B දක්වාත්, E සිට B දක්වාත්, F සිට B දක්වාත්, රේඛා ගමන් කර ඇත්තේ පර්යාලෝක ලක්ෂණවලට අනුව ය.



**ඉඟිය - 06**

පර්යාලෝකය යනු ළඟ-දුර අතර වෙනස වේ.

යමක් ළඟට පෙනෙන ප්‍රමාණයට වඩා ඈතට යන විට කුඩාවට පෙනෙයි. අවකාශය තුළ ගැඹුර දැක්වීම පර්යාලෝකය වේ. නිශ්චල ද්‍රව්‍ය ඇඳීමේ දී ඝනක, ඝනකාභ හැඩවල පර්යාලෝක ලක්ෂණ දැකිය හැකි ය.

පර්යාලෝක ලක්ෂණ මතු වන සේ ඒවා ඇඳිය යුතු ය.

## 2. ආධාරයකින් තොර ව නිදහස් අතින් ඝනකය ඇඳීමට හුරු වෙමු

- සිරස් රේඛා, හරි කෙළින් හා අදාළ රේඛා පර්යාලෝක ලක්ෂණවලට අනුව ඇඳීමට සැලකිලිමත් වන්න.



ඔබ ඉදිරියේ තබා ඇති ඝනකයේ පහත ලක්ෂණ හඳුනා ගන්න.




- ඔබ ඉදිරියේ ඇති ඝනකය හොඳින් නිරීක්ෂණය කරමින් පැන්සල් රේඛාවෙන් අඳුර-එළිය දක්වන්න.
- පර්යාලෝක ලක්ෂණ හා පරිමාණ ගැන සැලකිලිමත් වන්න.



ඝනකය අඳින්න.

අඳුර තද පැහැති රේඛාවෙන් දක්වන්න.

අතරමැදි අඳුර ලා පැහැති රේඛාවෙන් දක්වන්න.

- පහත ආකාරයට ඝනකය ඇඳ වර්ණ ගන්වන්න.



1 2 3 4

## පියවර - 5

ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න. ඔබගේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරින් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| ගෝලය, සිලින්ඩරය, ඝනකය ඇඳීම සඳහා සරල ක්‍රම භාවිත කිරීමට | | | | |
| පරිමාණානුකූල ව ගෝලය නිවැරදි ව ඇඳීමට | | | | |
| පරිමාණානුකූල ව සිලින්ඩරය නිවැරදි ව ඇඳීමට | | | | |
| පරිමාණානුකූල ව ඝනකය නිවැරදි ව ඇඳීමට | | | | |
| රේඛා ඇසුරෙන් ගෝලයෙහි ත්‍රිමානත්වය මතු කිරීමට | | | | |
| රේඛා ඇසුරෙන් සිලින්ඩරයෙහි ත්‍රිමානත්වය නිවැරදි ව මතු කිරීමට | | | | |
| රේඛා ඇසුරෙන් ඝනකයෙහි ත්‍රිමානත්වය නිවැරදි ව මතු කිරීමට | | | | |
| වර්ණ භාවිතයෙන් ගෝලයෙහි ත්‍රිමාන ලක්ෂණ නිවැරදි ව මතු කිරීමට | | | | |
| වර්ණ භාවිතයෙන් සිලින්ඩරයෙහි ත්‍රිමාන ලක්ෂණ නිවැරදි ව මතු කිරීමට | | | | |
| වර්ණ භාවිතයෙන් ඝනකයෙහි ත්‍රිමාන ලක්ෂණ නිවැරදි ව මතු කිරීමට | | | | |
| නිර්මාණ කාර්ය සාර්ථක ව නිමා කිරීමට | | | | |

## ඉදිරි පෝෂණය



- ගෝලය, සිලින්ඩරය, ඝනකය ඇඳීමට හා රේඛාවෙන් අඳුර-එළිය දැක්වීමට පුහුණු වන්න.
- විවිධ වර්ණ මාධ්‍යය භාවිතයෙන් අඳුර-එළිය දක්වා ත්‍රිමාන ලක්ෂණ මතු කිරීමට උත්සාහ කරන්න. (පැස්ටල්/පාට පැන්සල්/දිය සායම්/පෝස්ටර් සායම්)

# 04

කාලච්ඡේද 02යි

# මිනිස් රූප අඳිමු



**දුවේ, පුතේ, මිනිස් සිරුරක් නිවැරදි ව ඇඳීමට මෙම ක්‍රියාකාරකමෙන් ඉඩ සැලසේ. ඒ අනුව ජ්‍යාමිතික හැඩ හා ගණිත මිනුම් සමග සෘජු හා රිද්මානුකූල ව මිනිස් රූප ඇඳීමට අපි යොමු වෙමු.**

**මෙම ක්‍රියාකාරකම මගින්**

- මානව ශරීරයේ මූලික මිනුම් හා ජ්‍යාමිතික හැඩ නිවැරදි ව ගළපා සලකුණු කිරීම
- සරල හැඩතල ඇසුරෙන් මිනිස් රූප ඇඳීම
- පැති පෙනුම හා පිටුපස පෙනුම අනුව මිනිස් රූප ඇඳීම
- රිද්මානුකූල හැඩතල අනුව මිනිස් රූප ඇඳීම
- සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීම

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

**අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පුවත්පත්, සඟරා හා දින දර්ශනවල දක්නට ලැබෙන සිටගෙන සිටින ගැහැනු සහ පිරිමි රූප (මෙම රූප අවම වශයෙන් A4 ප්‍රමාණයේ වීම වැදගත් ය.)
- පැන්සල් (2B, 4B)

## පියවර 1

දුවේ, පුතේ, ගුරුතුමා/තුමියගේ උපදෙස් මත කණ්ඩායම් වන්න. නිරීක්ෂණ පත්‍රිකා අධ්‍යයනය කරමින් පිළිතුරු සාකච්ඡා කරන්න. අවශ්‍ය තොරතුරු පොතෙහි ඇතුළත් කර ගන්න.




### නිරීක්ෂණ පත්‍රිකාව -1

වැඩිහිටි මිනිස් සිරුරක ප්‍රමාණය හිස මෙන් 7 1/2ක ගුණයකින් සමන්විත වීම රූප සටහනට අනුව නිරීක්ෂණය කරන්න. (ගැහැනු /පිරිමි)

**ඔබේ පොතේ මෙය සටහන් කර ගෙන හිස්තැන් පුරවා ගන්න.**

හිස මෙන් ගෙල ................................ ගුණයක් වේ.

හිස මෙන් පපුව ................................. ගුණයක් වේ.

හිස මෙන් කඳ ................................... ගුණයක් වේ.

හිස මෙන් අත් .................................. ගුණයක් වේ.

හිස මෙන් පාද .................................. ගුණයක් වේ.

### නිරීක්ෂණ පත්‍රිකාව -2

දී ඇති ජ්‍යාමිතික හැඩ මිනිස් සිරුරේ අංග සමග ගළපන්න.



ජ්‍යාමිතික හැඩ

| |
|---|
| හිස |
| ගෙල |
| කඳ |
| ඉණ |
| අත් |
| පාද |

මිනිස් සිරුරේ අංග



මිනිස් සිරුර

## පියවර 2 - ශරීර ප්‍රමාණ හා ජ්‍යාමිතික හැඩ සලකුණු කිරීම

- ඉහත කණ්ඩායම් නිරීක්ෂණ අනුව මිනිස් රූප ඇඳීමට යොමු වෙමු. ඔබ ළඟ ඇති ගැහැනු පිරිමි ඡායාරූප/පින්තූර හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් අභ්‍යාසවල නිරත වන්න. ඒ සඳහා පහත ආදර්ශ ඇසුරු කර ගන්න.
- රූපය මැදින් සිරස් රේඛාවක් ඇඳ, හිසෙහි උස මෙන්/ ශරීරයේ ඉතිරි කොටස් තිරස් ඉරි මඟින් වෙන් කර ගන්න. 3 රූපය ආදර්ශයට ගන්න.




3 රූපය

- එම සැලැස්ම මත 4 රූපයේ මෙන් ශරීරයේ අංග/කොටස් සඳහා ජ්‍යාමිතික හැඩ යෙදිය හැකි තැන් සලකුණු කරන්න. පසුව රූපය වටා බාහිර රේඛාව ද ඇඳ ගන්න.




4 රූපය

## පියවර 3- ජ්‍යාමිතික හැඩ ඇසුරින් පරිමාණානුකූල ව ඇඳීම

- ඔබ විසින් ඡායාරූපයේ සටහන් කර ගත් ජ්‍යාමිතික හැඩ හා ප්‍රමාණ ආදර්ශයට ගනිමින් මිනිස් රූපයක් ඇඳ ගැනීමට යොමු වෙමු.





- මිනිස් රූපයක පැති පෙනුම ඇඳීමට යොමු වෙමු. ඒ සඳහා දී ඇති ආදර්ශ සැලකිල්ලට ගන්න.




මිනිස් රූපයක පිටුපස පෙනුම ඇඳීමට යොමු වෙමු. ඒ සඳහා දී ඇති ආදර්ශය සැලකිල්ලට ගන්න.



## පියවර 4 - හිටි රූප (ඍජු ඉරියව්ව) රිද්මානුකූල ව ඇඳීම

- පිරිමි හා ගැහැනු රූපවල උරහිස්, ඉන හා දණහිස් පහත රූප සටහනට අනුව සලකුණු කර රිද්මානුකූල රූප ඇඳ ගැනීමට යොමු වන්න.



## පියවර 5

ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න. ඔබගේ සහ අන් අය අඳින ලද නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| ශරීරයේ කොටස් සඳහා මිනුම් හා මූලික ජ්‍යාමිතික හැඩ නිවැරදි ව ගළපා ගැනීමට | | | | |
| ශරීරයේ කොටස් සඳහා ජ්‍යාමිතික හැඩ සාර්ථක ව ලකුණු කිරීමට | | | | |
| සරල හැඩතල ඇසුරෙන් මානව රූප නිවැරදි ව ඇඳීමට | | | | |
| පැති පෙනුම නිවැරදි ව ඇඳීමට | | | | |
| පසුපස පෙනුම නිවැරදි ව ඇඳීමට | | | | |
| රිද්මානුකූල ඉරියව් නිවැරදි ව දැක්වීමට | | | | |
| නිර්මාණ කාර්යය සාර්ථක ව නිමා කිරීමට | | | | |



# 05

කාලච්ඡේද 02යි

# සත්ත්ව රූප අඳිමු





**දුවේ, පුතේ, මෙම ක්‍රියාකාරකමෙන් නිතර දකින සතුන් ඇඳීමට මඟ පෙන්වා ඇත. මෙම ක්‍රියාකාරකමෙන් ඕනෑ ම සත්ත්ව රූපයක් ඇඳීම සඳහා අද්දැකීමක් ඔබට ලබා ගැනීමට හැකියාව ලැබේ.**

### අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

- චිත්‍ර ඇඳීමේ කඩදාසි
- පැන්සල් (HB, 2B)

**මෙම ක්‍රියාකාරකම මගින්**

- ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් සතුන්ගේ ලක්ෂණ නිවැරදි ව දැක්වීම
- සරල ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් අලියාගේ, පූසාගේ, කුකුළාගේ හා බල්ලාගේ රූපය ඇඳීම
- සතුන්ගේ අංග හා ගති ලක්ෂණ නිවැරදි ව ඇඳීම
- සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීම

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

## පෙර සූදානම

ඔබ නිතර දකින සතුන් (අලියා, පූසා, කුකුළා, බල්ලා) හොඳින් නිරීක්ෂණය කරන්න. (අන්තර්ජාලය, මුද්‍රිත ඡායාරූප, රූපවාහිනිය සහ වීඩියෝ දර්ශන ද භාවිතයට ගන්න).



## පියවර - 1

දුවේ පුතේ ජ්‍යාමිතික හැඩතල එකතුවෙන් අලියෙක් පහසුවෙන් අඳින අයුරු අභ්‍යාස කරමු.

### නිරීක්ෂණ පත්‍රිකාව -1

මෙම ජ්‍යාමිතික හැඩතල හොඳින් නිරීක්ෂණය කරන්න.




A - වෘත්තය

B - ත්‍රිකෝණය

C - සමචතුරස්‍රය

D - සෘජුකෝණාස්‍රය

ඉහත ඔබ නිරීක්ෂණය කළ ජ්‍යාමිතික හැඩතල අලියාගේ රූපය ඇඳීමේ දී යෙදිය හැකි තැන් හා ආකාර නිදර්ශනයක් ලෙස දක්වා ඇත.



**ලද අද්දැකීමෙන් ඔබේ පිළිතුරු සපයන්න**

**ඔබේ පොතේ මෙය සටහන් කර ගෙන හිස්තැන් පුරවා ගන්න.**

අලියාගේ හිස සඳහා ....................................... යෙදීම සුදුසු වේ.

අලියාගේ බඩ සඳහා ....................................... යෙදීම සුදුසු වේ.

අලියාගේ පාද සඳහා ....................................... යෙදීම සුදුසු වේ.

අලියාගේ කන සඳහා ....................................... යෙදීම සුදුසු වේ.

අලියාගේ හොඬවැල සඳහා ....................................... යෙදීම සුදුසු වේ.

- අලියා මත ඇඳි ජ්‍යාමිතික හැඩතල ඒ ආකාරයෙන් ම ඔබගේ චිත්‍ර පොතෙහි ඇඳ ගන්න.
- අලියාගේ රූපය හොඳින් නිරීක්ෂණය කරමින් ජ්‍යාමිතික කොටස්වලට අමතර ව පහත අංග එකතු කරන්න.
  - ඇස යෙදීම
  - කන ඇඳීම
  - හිස සහ කඳ එක් කිරීම
  - නියමිත ආකාරයට පාද ඇඳීම
  - අවසන් නිමාවක් ලබා ගන්න.



දුවේ, පුතේ, ඔබ අඳිනු ලැබූ අලියා මෙරට ජාතික, ආගමික, සංස්කෘතික හා ආර්ථික යන සෑම අංශයෙන් ම ඉතා වැදගත් සතෙක්. වර්තමානයේ කෘෂිකර්මාන්තය, කාර්මිකකරණය හා නාගරීකරණය නිසා අලින් හා මිනිසුන් අතර ගැටුම් උග්‍ර ව පවතින බව ජන මාධ්‍ය වෙතින් ඔබට අසන්න දකින්න පුළුවන්. මේ ගැටුමට ඔබට විසඳුමක් යෝජනා කළ හැකි නම්, එය රචනාවක් ලෙස ලියා ඔබේ ගුරුතුමාට/ගුරුතුමියට භාර දෙන්න.



## පියවර - 2

දුවේ, පුතේ, ජ්‍යාමිතික හැඩ එකතුවෙන් ඔබේ නිවසේ දක්නට ලැබෙන පූසෙක් පහසුවෙන් අඳින අයුරු අභ්‍යාස කරමු.

<u>නිරීක්ෂණ පත්‍රිකාව -2</u>

පූසාගේ මුහුණ, ඇස්, කන්, නාසය, කඳ, කකුල් හා වලිගය ඇඳීම සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල නම් කරන්න.

එම හැඩ පොතේ සටහන් කරගන්න.



- ඔබ විසින් නිරීක්ෂණය කළ ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් පූසාගේ මූලික හැඩය ඔබගේ චිත්‍ර පොතෙහි අඳින්න.
- එම ප්‍රධාන හැඩවලට අමතර ව පහත සඳහන් අංග එකතු කරමින් පූසාගේ රූපය සම්පූර්ණ කරන්න.
  - ඇස යෙදීම
  - කන ඇඳීම
  - හිස සහ කඳ එක් කිරීම
  - නියමිත ආකාරයට පාද ඇඳීම
  - වලිගය ඇඳීම
  - නිමාවක් ලබා ගන්න.



දුවේ, පුතේ, ඔබ මෙම ක්‍රියාකාරකමේ දී ඇඳීමට හුරුව ලබන පූසා සහ බල්ලා බොහෝ විට ඔබේ සුරතලකු වන්නට පුළුවන්. අපට සතුට, ආරක්ෂාව ලබා දෙන මෙම සුරතල් සතුන් නිසා මාරාන්තික ජලභීතිකාව වැනි රෝගී තත්ත්ව ඇති විය හැකි බව ඔබ දැන සිටියා ද? අපේ සුරතලාගේ සහ අපේ ආරක්ෂාව වෙනුවෙන් ජලභීතිකා එන්නත (Rabies Vaccine) ලබා දීමට උනන්දු වෙමු. වැඩි විස්තර ඔබ ප්‍රදේශයේ පශු වෛද්‍යවරයාගෙන් ලබා ගන්න පුළුවන්.



## පියවර - 3

දුවේ, පුතේ, ඔබ දැක ඇති හෝ ඔබගේ ගෙදර දොරේ වත්ත පහළ දක්නට ලැබෙන කුකුළකු පහසුවෙන් අඳින අයුරු අභ්‍යාස කරමු.



### නිරීක්ෂණ පත්‍රිකාව -3

කුකුළාගේ ශරීර අංගවලට යෙදිය හැකි වඩාත් සුදුසු ජ්‍යාමිතික හැඩ හඳුනාගෙන එම හැඩ පොතේ සටහන් කර ගන්න.

අධ්‍යයනය කරන ලද ජ්‍යාමිතික හැඩ අනුව කුකුළාගේ මූලික හැඩය චිත්‍ර පොතෙහි ඇඳ ගන්න. එම හැඩවලට අමතර ව පහත දැක්වෙන අනෙකුත් කොටස් සම්පූර්ණ කර ගන්න.

- කුකුළාගේ උඩ කරමලය හා පහළ කරමලය
- කුකුළාගේ හොට
- පෙඳය
- කකුල්



දුවේ පුතේ, ඔබ ආශාවෙන් ඇඳ නිම කළ කුකුළා මෙරට ඉතිහාසයේ ආදිතමයන් සමග සමීප ව වාසය කළ පක්ෂියෙක්. විශේෂයෙන් අපේ මුතුන් මිත්තන් කුකුළාගේ මිහිරි නාදයෙන් උදෑසන අවදි විය. එමෙන් ම කුකුළාගේ රුව සුබ ලකුණක් ලෙස ද සැලකේ.



## පියවර - 4

දුවේ පුතේ ඔබ දැක ඇති හෝ ඔබගේ ගෙදර දොරේ වත්ත පහළ දක්නට ලැබෙන බල්ලකුගේ රූපයක් පහසුවෙන් අඳින අයුරු අභ්‍යාස කරමු.



නිරීක්ෂණ පත්‍රිකාව - 4

බල්ලාගේ ශරීර අංගවලට යෙදිය හැකි වඩාත් සුදුසු ජ්‍යාමිතික හැඩ නම් කරමින් එම හැඩ පොතේ සටහන් කර ගන්න.

අධ්‍යයනය කරන ලද ජ්‍යාමිතික හැඩ අනුව බල්ලාගේ මූලික හැඩය චිත්‍ර පොතෙහි ඇඳ ගන්න. එම හැඩවලට අමතර ව පහත දැක්වෙන අනෙකුත් කොටස් සම්පූර්ණ කර ගන්න.

- බල්ලාගේ හොම්බ,
- ඇස, කන්, නාසය,
- කකුල් සහ ඇඟිලිවල හැඩය
- වලිගය



දුවේ පුතේ, ඔබ ආශාවෙන් ඇඳ නිම කළ බල්ලා මෙරට ඉතිහාසයේ සිට අපේ මානවයා සමග සමීප ව වාසය කළ සත්ත්වයෙක්.

## පියවර - 5

ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න. ඔබගේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරෙන් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| **මට දැන් පුළුවන්** | **හැකියා මට්ටම** | | | |
|---|---|---|---|---|
| | **4** | **3** | **2** | **1** |
| ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් සතුන්ගේ ලක්ෂණ නිවැරදි ව දැක්වීමට | | | | |
| සරල ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් අලියාගේ රූපය ඇඳීමට | | | | |
| සරල ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් පූසාගේ රූපය ඇඳීමට | | | | |
| සරල ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් කුකුළාගේ රූපය ඇඳීමට | | | | |
| සරල ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් බල්ලාගේ රූපය ඇඳීමට | | | | |
| සතුන්ගේ අංග හා ගති ලක්ෂණ නිවැරදි ව ඇඳීමට | | | | |
| සාර්ථක ව සමස්ත කාර්ය නිමා කිරීමට | | | | |

## අනාගතයට ඉඟියක්

මෙම ක්‍රියාකාරකම් ඇසුරින් ඔබ ලබා ගත් අද්දැකීම් භාවිතයෙන් විවිධ නිර්මාණ කිරීමෙන් ඒවාට වෙළෙඳ පොළ වටිනාකමක් ලබා ගත හැකි ය.

- ලාංඡන
- රෙදිපිළි සඳහා මෝස්තර
- විවිධ මූර්ති
- පාරිභාරික භාණ්ඩ

ලාංඡන




## රෙදිපිළි අලංකරණය සඳහා මෝස්තර



## අලංකරණ භාණ්ඩ





# 06

කාලච්ඡේද 01යි

# සිද්ධාන්ත ඉගෙන ගනිමු

**මෙම ක්‍රියාකාරකම මගින් මූලික රේඛා, හැඩතල හා වර්ණ සහ ඒවාට අදාළ අභ්‍යාස ඉදිරිපත් කෙරේ. එමගින් චිත්‍ර ඇඳීමට අත්‍යවශ්‍ය දෘශ්‍ය මූලිකාංග සම්බන්ධ කුසලතා ලබා ගත හැකි වේ. චිත්‍ර මූලධර්ම ලෙස පර්යාලෝකය, පරිමාව හා සමබරතාව සම්බන්ධ ඉගෙනුම් අද්දැකීම් ද මෙම ක්‍රියාකාරකමින් ලබා දෙනු ඇත.**



**අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ**

- චිත්‍ර අඳින කඩදාසි
- පැස්ටල්/ දියසායම්/ පෝස්ටර් සායම්

**මෙම ක්‍රියාකාරකම මගින්**

- මූලික රේඛා හා හැඩ හඳුනා ගනිමින් ඇඳ ගැනීම
- මූලික වර්ණ නම් කරමින් නිවැරදි ව භාවිත කිරීම
- වර්ණ චක්‍රය ඇඳ වර්ණ කිරීම
- මූලධර්ම අධ්‍යයනය කිරීම
- සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීම,

**යන හැකියා ඔබට ලැබෙනු ඇත.**

## පියවර 1

දුවේ පුතේ, ගුරුතුමා/තුමියගේ උපදෙස් මත කණ්ඩායම් ගත වන්න. නිරීක්ෂණ පත්‍රිකා අධ්‍යයනය කරමින් පිළිතුරු සාකච්ඡා කරන්න. අවශ්‍ය තොරතුරු පොතෙහි ඇතුළත් කර ගන්න.

<u>නිරීක්ෂණ පත්‍රිකාව -1</u>

මෙම ඡායාරූපය හොඳින් නිරීක්ෂණය කරන්න. එහි දැක්වෙන වර්ණ, රේඛා, හැඩතල පිළිබඳ සාකච්ඡා කරමින් ඉදිරිපත් කරන්න.



## පියවර 2 - මූලික රේඛා, ජ්‍යාමිතික හැඩතල හා වර්ණ අධ්‍යයනය

- පහත දී ඇති තොරතුරු හා රූප හොඳින් අධ්‍යයනය කරන්න.
- අධ්‍යයනය කරන තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

### 1. මූලික රේඛා අධ්‍යයනය

දී ඇති රේඛා හා ඊට වඩාත් සුදුසු නාමය තෝරා ඉදිරිපත් කරන්න.

**රේඛා වර්ග**



| රේඛා නාමය |
|---|
| ඇල රේඛාව |
| තිරස් රේඛාව |
| සිරස් රේඛාව |
| වක්‍ර රේඛාව |
| දැති (සිග් සැග්) රේඛා |

රේඛාව යම් කිසි වස්තුවක බාහිර සීමාව ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය. රේඛාවේ මූලික ස්වරූප ලෙස තිරස් (*horizontal*), සිරස් (*vertical*), ඇල (*diagonal*), දැති (සිග් සැග්-*zigzag*), වක්‍ර (*curved*)) ලෙස හැඳින්වේ.

- මෙම මූලික රේඛා ඔබේ පොතේ ඇඳ ගන්න.

## 2. මූලික හැඩ අධ්‍යයනය

හැඩ සම්බන්ධ තොරතුරු අධ්‍යයනය කර, දී ඇති හැඩ හා ඊට වඩාත් සුදුසු නාමය තෝරා ඉදිරිපත් කරන්න.

චිත්‍ර ඇඳීම සඳහා භාවිත කරන මූලික ජ්‍යාමිතික හැඩ 4ක් වේ. එනම්,

- කේතුව
- සිලින්ඩරය
- ඝනකය හා
- ගෝලය වේ.



■ මෙම හැඩ ඔබේ පොතේ ඇඳ ගන්න.

## 3. වර්ණ අධ්‍යයනය

නිල්, කහ, රතු චිත්‍ර කලාවේ මූලික වර්ණ (primary colours) ලෙස සැලකේ. මෙම වර්ණ මිශ්‍ර වීමෙන් ද්විතීයික වර්ණ (secondary colours) නිර්මාණය වේ.



1 රූපය



2 රූපය

ද්විතීයික වර්ණ සකස් කිරීම සඳහා කඩදාසියක් මත ඉහත 1 රූප සටහන ඇඳ මූලික වර්ණ සමග ද්විතීයික වර්ණ සකස් වන ආකාරය අත්හදා බලන්න. ඒ අනුව 2 රූපය අනුව කොටු මත මූලික වර්ණ දෙකක් සමග ද්විතීයික වර්ණ සකස් වන ආකාරය චිත්‍ර පොතේ ඇඳ දක්වන්න.

## පියවර 3 - වර්ණ චක්‍රය ඇඳ වර්ණ ගැන්වීම

- පළමු ව කවකටුව භාවිත කර අරය අඟල් 3ක් සිටින ලෙස රවුමක් ඇඳ ගන්න. (1 රූපය)
- කවකටුවේ දුර වෙනස් නොකර වෘත්තය වටා චාප ලකුණු කර වෘත්තය සමාන කොටස් 6කට බෙදන්න. (2 රූපය)
- නැවත එහි ඇතුළත කේන්ද්‍රයේ සිට අඟල් 2ක අරය සහිත රවුමක් ඇඳ ගන්න. (3 රූපය)
- මධ්‍ය ලක්ෂ්‍යයේ සිට වෘත්තය සමාන කොටස් තුනකට රූප සටහනේ ආකාරයට බෙදන්න. (4 රූපය)
- නිවැරදි ව වර්ණ මිශ්‍ර කර වර්ණ චක්‍රය වර්ණ ගන්වන්න (5 රූපය).






## පියවර 4 - මූලධර්ම අධ්‍යයනය

පහත දී ඇති තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න.

| පර්යාලෝකය | සමබරතාව | පරිමාණය |
| --- | --- | --- |
| පර්යාලෝක ලක්‍ෂණය ලෙස පෙරබිම (*foreground*), මැදබිම (middle ground) සහ පසුබිම (back ground) යන සාධක සමග ආසන්න වස්තුව විශාල වී දුර වස්තූන් කුඩා වීමත් සැලකිල්ලට ගැනේ. | සමබරතාව යනු වර්ණ, රේඛා, හැඩ යන මූලිකාංග සමතුලිත ව නිර්මාණයක් තුළ පිහිටුවීම වේ. | පරිමාණය යනුවෙන් අදහස් කරනුයේ කිසියම් රූපයක ඊට ආවේණික වන මිනුම් ලක්ෂණ ය. එහි දී හැඩයක පළල අනුව උස කොපමණ ද යන්න ආදි වශයෙන් ගලපා බලනු ලබයි. |

මෙහි දක්වා ඇති රූපවලට අදාළ මූලධර්ම සාකච්ඡා කර ඉදිරිපත් කරන්න.





- පන්ති කාමරයේ දක්නට ලැබෙන භාණ්ඩ / උපකරණ හොඳින් නිරීක්ෂණය කරන්න.

- ඔබ තෝරා ගත් එක් භාණ්ඩයක් පිළිබඳ පහත සඳහන් එක් එක් මූලිකාංග හා මූලධර්ම යටතේ විස්තරයක් ඉදිරිපත් කරන්න.
    - රේඛා
    - වර්ණ
    - හැඩතල/ හැඩ
    - පර්යාලෝකය
    - සමබරතාව
    - පරිමාව හා පරිමාණය
- දී ඇති නිර්මාණය ඇසුරු කර ගෙන ඉහත දක්වා ඇති මූලිකාංග හා මූලධර්ම සාකච්ඡා කරමින් නිර්මාණය ඇගයීමට ලක් කරන්න.

## පියවර 5

ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න. ඔබගේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. පහත දී ඇති වගුව ඇසුරින් ඔබේ හැකියා මට්ටම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| මූලික රේඛා නිවැරදි ව නම් කිරීමට හා ඇඳීමට | | | | |
| මූලික හැඩ නිවැරදි ව නම් කිරීමට හා ඇඳීමට | | | | |
| මූලික වර්ණ නම් කරමින් නිවැරදි ව භාවිත කිරීමට | | | | |
| වර්ණ චක්‍රය ඇඳ වර්ණ කිරීමට | | | | |
| මූලධර්ම නිවැරදි ව දැක්වීමට | | | | |
| සාර්ථක නිමාවක් දක්වා අනුපිළිවෙළකට කාර්ය කිරීමට | | | | |

# චිත්‍ර කලාව

පළමු වාරය

අත්‍යවශ්‍ය ඉගෙනුම් මොඩියුලය - II

**6 ශ්‍රේණිය**

## දිව්‍ය සරසන සිත් රූ නිමැවුම්



## මොඩියුලය II - හැඳින්වීම

ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා නිර්මාණ කිරීමට හා නිර්මාණ තෝරා ගැනීමට අවශ්‍ය මූලික දැනුම, කුසලතා හා යහපත් ආකල්ප ලබා ගැනීමේ ඉගෙනුම් අවස්ථා මෙම මොඩියුල හැදෑරීමෙන් ඔබට ලැබෙනු ඇත. මොඩියුලයේ අන්තර්ගත ක්‍රියාකාරකම්වලට අයත් නිර්මාණ අප විසින් භාවිතයට ගන්නා දේවල් ය. ඒවා ව්‍යවහාරික කලාවන්ට අයත් වේ. එම නිර්මාණ කිරීමේ දී ඔබට අනෙකුත් විෂයයන් ගෙන් ලබාගත් දැනුම ද උපයෝගී කර ගැනීමට හැකි ය. එමෙන් ම පහත සඳහන් කුසලතා ද ඔබට ළඟා කර ගැනීමට අවස්ථාව සැලසේ.

### චින්තනමය කුසලතා

- විචාරාත්මක බව
- නිර්මාණශීලී බව
- තර්කානුකූල බව
- තීරණ ගැනීම
- ගැටලු විසඳීම

### සමාජමය කුසලතා

- සහනුභූතික බව
- කණ්ඩායම් හැඟීම
- සන්නිවේදන කුසලතා
- නායකත්වය
- අන්තර් පුද්ගල හැකියා

### පෞද්ගලික කුසලතා

- ව්‍යවසායකත්ව කුසලතා
- ආරම්භක හැකියා
- නම්‍යශීලී බව
- වගවීම හා වගකීම
- ස්වයං විනය

### සිසුන්ට උපදෙස්

**මෙම පොත ඔබට පමණක් නොවේ. ඔබට පහළ ශ්‍රේණිවල ඉගෙනුම ලබන සොයුරු සොයුරියන් වෙනුවෙන් ද සුරකින්න.**

ස්වාධීන ව ක්‍රියාකාරකම්හි නිරත වන්න. අවශ්‍ය විට ගුරු උපදෙස් ලබා ගන්න.




මෙම මොඩියුලයෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් විචාරාත්මක ව හා තාර්කික ව ව්‍යවහාරික ලෝකයට අවශ්‍ය නව නිර්මාණ බිහි කිරීමට හා ව්‍යවසායකත්ව සංකල්ප වර්ධනය කර ගැනීමට ඔබට හැකි වේ.

## මොඩියුලය II මගින් ආවරණය කෙරෙන ඉගෙනුම් පල

- රෙදිපිළි, කඩදාසි වැනි විවිධ ද්‍රව්‍ය මතුපිට ව්‍යාප්ත සැරසිලි සහිත නිර්මාණ කරයි.
- විවිධ සුභපැතුම් පත්, ආරාධනා පත් සහ පොත් පිටකවර වැනි මුද්‍රණ අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.
- ඇඹීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් මිනිස් හා සත්ත්ව රූප ආශ්‍රිත මූර්ති නිර්මාණ කරයි.
- නිර්මාණකරණයෙන් ලබන කුසලතා ජීවිතයේ වෙනත් විවිධ අවශ්‍යතා සාර්ථක කර ගැනීමට භාවිත කරයි.
- නිර්මාණ ඉදිරිපත් කිරීමේ, රස විඳීමේ හා ඇගයීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

## පූර්ව පරීක්ෂාව

පහත වගුවේ දැක්වෙන කුසලතා පිළිබඳ ව ඔබගේ පෙර දැනුම පරීක්ෂා කර ගන්න.

| කුසලතා | මට්ටම | | |
|---|---|---|---|
| | ඉතා හොඳින් පුළුවන් | හොඳින් පුළුවන් | තරමක් පුළුවන් |
| 1. විවිධ අවශ්‍යතා සඳහා රෙදිපිළි, කඩදාසි වැනි ද්‍රව්‍ය මත ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කිරීමට | | | |
| 2. සුබපැතුම් පත්, ආරාධනා පත්, පොත් පිටකවර වැනි මුද්‍රණ අවශ්‍යතා සඳහා නිර්මාණ කිරීමට | | | |
| 3. ඇඹීමේ ශිල්ප ක්‍රමයෙන් මිනිස් හා සත්ත්ව රූප නිර්මාණය කිරීමට | | | |
| 4. නිර්මාණකරණයෙන් ලබන කුසලතා වෙනත් අවශ්‍යතා සඳහා භාවිතයට ගැනීමට | | | |
| 5. නිර්මාණ ප්‍රදර්ශනයට, අන් අයගේ නිර්මාණ රසවිඳීමට සහ ඇගයීමට | | | |



අපිට ලැබුණු මේ මොඩියුලය හොඳින් භාවිත කර, මගේ පාසලේ නංගිලා මල්ලිලා වෙනුවෙන් ද සුරැකිව ලබා දෙන්න අපි පොරොන්දු වෙනවා.



# 01
# ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරමු

**කාලච්ඡේද 02යි**

## හැඳින්වීම



ස්වාභාවික ද්‍රව්‍ය සමග උචිත වර්ණ මාධ්‍ය භාවිතයෙන් අච්චු මුද්‍රණ ක්‍රමය උපයෝගී කර ගෙන ව්‍යාප්ත සැරසිලි නිර්මාණ කිරීමට හැකි ය. ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කිරීම පිළිබඳ අවබෝධය හා කුසලතාව ඔබේ ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා ද භාවිත කළ හැකි වේ.

### මෙම ක්‍රියාකාරකම මගින්,

- ශාක පත්‍ර හොඳින් නිරීක්ෂණය කර එහි ලක්ෂණ ලියා දැක්වීම
- ව්‍යාප්ත සැරසිල්ලක තිබිය යුතු මූලිකාංග පිළිබඳ අවබෝධයෙන්, දළ සටහන් ඇඳීම
- කාර්යයට උචිත ද්‍රව්‍ය හා උපකරණ නිවැරදි ව හැසිරවීම
- අච්චු මුද්‍රණය ශිල්ප ක්‍රමය භාවිතයෙන් අවශ්‍යතාවට උචිත හැඩතල හා වර්ණ තෝරා ගෙන සංයමයෙන් යුතු ව නිර්මාණ කිරීම
- නිර්මාණය ඉදිරිපත් කිරීම, අගය කිරීම හා රස විඳීම,

යන හැකියා ඔබට ලැබෙනු ඇත.

## පන්තිකාමර ඉගෙනුම් ක්‍රියාකාරකම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය සහ සහ උපකරණ රැගෙන යන්න.

- සනකම් නාරටියකින් යුත් එක ම වර්ගයට අයත් විවිධ ප්‍රමාණයේ ශාක පත්‍ර
- රෙදි පින්තාරු තීන්ත (Fabric paints)
- ජ්‍යාමිතික උපකරණ
- පැස්ටල් (Pastel)
- පැන්සලක්, චිත්‍ර අඳින කඩදාසි
- කුඩා පින්සලක් (No. 4 හෝ 6)
- ජලය
- කුඩා ප්‍රමාණයේ ස්පොන්ජ් කැබලි කිහිපයක්
- ඉටිරෙදි/පොලිතීන් කැබැල්ලක් (අඟල් 13x13 පමණ)
- ඩ්‍රෝවින් බෝ(ර්)ඩ් එකක් (Drawing board)
- අමුරෙදි හෝ වෙනත් නති පැහැති ලා වර්ණයේ කපු රෙදි කැබැල්ලක් (අඟල් 12x12 පමණ)
- ඇණ (Drawing pin) හෝ ඇල්පෙනෙති කිහිපයක්
- තීන්ත මිශ්‍ර කිරීමට කුඩා භාජනයක් (පැතලි දීසියක් හෝ පිඟානක්)

### පෙර සූදානම සඳහා ක්‍රියාකාරකම

ආදරණීය දුවේ, පුතේ,

පන්තිකාමර ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුභවතාගේ උපදෙස් අනුව පහත ක්‍රියාකාරකම ඔබ විසින් නිවසේ දී සම්පූර්ණ කර නියමිත දිනයේ දී එම නිර්මාණ ද රැගෙන පන්තියට පැමිණෙන්න.



**කවින්‍යා තම අයියා සමග නිවසේ දී කරන ලද නිර්මාණය ඔබත් අත්හදා බලන්න. ඔබේ නිර්මාණය පාසලට රැගෙන යන්න.**

කවින්‍යා දිනක් සවස් වරුවේ තම ගෙවත්තේ මල් පැළවලට වතුර දමමින් සිටින අතරතුර ශාක පත්‍රවල ඇති විවිධතා කිහිපයක් දුටුවා ය.

චිත්‍ර ඇඳීමට ඉතා ප්‍රිය කළ කවින්‍යා විසින් එම ශාක පත්‍ර කිහිපයක්, ශාකයට හානි නොවන පරිදි කඩා ගත් අතර, බිම වැටී තිබුණ ශාක පත්‍ර කිහිපයක් ද අහුලා ගන්නා ලදී.



අනතුරු ව ඇය එම ශාක පත්‍ර තම චිත්‍ර පොතෙහි ඇඳීමට උත්සාහ ගන්නා ආකාරය දුටු ඇයගේ අක්කා, එම කොළ භාවිතයෙන් සරල නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් කරන අන්දම කවින්‍යාට කියා දුන්නේ ය.

ශාක පත්‍ර අතර තිබූ ඝනකම නාරටියක් සහිත ශාක පත්‍රයක් තෝරා ගන්නා ලෙස අක්කා කවින්‍යාට පැවසීය.

කවින්‍යා ඉතා ආශාවෙන් අක්කා කියා දුන් ක්‍රියාකාරකම පහත සඳහන් ආකාරයට ආරම්භ කළා ය.

- ශාක පත්‍රයේ නාරටි සහිත පැත්ත උඩට සිටින සේ හරවා තබන ලදී.
- ඉන්පසු චිත්‍ර ඇඳීමට භාවිත කරන කඩදාසියක් ඒ මත තබන ලදී.
- පැස්ටල් කූරෙන් කොටසක් කඩා ගෙන පැත්ත පෙරළා, ශාක පත්‍රය ඇති සීමාව තුළ පමණක් වර්ණ තැවරුවා ය.









- අනතුරු ව විවිධ වර්ණ ගෙන ශාක පත්‍රය චිත්‍ර අඳින කොළය පුරා නිදහසේ ව්‍යාප්ත කරන්නට අක්කා තම නැගණියට උපදෙස් දුන්නේ ය.



**ඉඟිය 01**

ශාක පත්‍ර මත රෙදි පින්තාරු තීන්ත, පෝස්ටර් වර්ණ, දියසායම් වැනි වර්ණ මාධ්‍යයක් තවරා මුද්‍රණ ලබා ගැනීමට හැකි ය. මෙම ක්‍රමය **අච්චු මුද්‍රණය** ලෙස හැඳින්වේ.

දුවේ, පුතේ,

**පන්තිකාමර ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර පහත කරුණු පිළිබඳ සිතන්න, සොයන්න, ගුරුතුමියගෙන්/ගුරුතුමාගෙන් විමසන්න.**

## ව්‍යාප්ත සැරසිල්ලක් කියන්නේ කුමක් ද?

ක්‍රමවත් ව සකසන ලද සැරසිලි ඒකකයක් හෝ ඒකක කිහිපයක් සීමාවකින් තොර ව විධිමත් ව හෝ අවිධිමත් ව තලය මත යෙදවීම ව්‍යාප්ත සැරසිල්ලක් ලෙස හැඳින්විය හැකි ය.

## ව්‍යාප්ත සරසිල්ලක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු

- සැරසිලි ඒකකයක් සැලසුම්කරණයේ දී අවකාශයට ගැළපෙන ප්‍රමාණ තෝරා ගැනීම
- මෝස්තර ඒකකය ව්‍යාප්ත කරන ආකාරය/රටාව
- අවශ්‍යතාවට උචිත බව
- නිර්මාණාත්මකභාවය හා අලංකාරය
- ශිල්ප ක්‍රම භාවිතය
- විවිධ අවශ්‍යතා සඳහා මතුපිට අලංකරණ ලෙස භාවිත කළ හැකි බව
- පුනර්භාවිතය (නැවත නැවත යෙදීම)
- වර්ණ ගැළපීම
- ප්‍රයෝජනවත් බව

# නෙක තුරු පත් රටා මවමු

**අච්චු මුද්‍රණ ශිල්ප ක්‍රමය භාවිතයෙන් අලංකාර ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය.**

## පියවර 01

- ඔබ විසින් නිවසේ දී කරන ලද නිර්මාණය යහළුවන්ට පෙන්වා එය සිදු කළ ආකාරය, වර්ණ, හැඩතල ගැළපීම හා ශාක පත්‍රය කඩදාසිය මත ව්‍යාප්ත කර ඇති අලංකාරය පිළිබඳ අදහස් බෙදා හදා ගන්න.
- ඔබ විසින් රැගෙන ආ ශාක පත්‍ර සැරසිලි ඒකක ලෙස හා භාවිත කර ව්‍යාප්ත සැරසිල්ලක් රෙදි කැබැල්ල මත නිර්මාණය කිරීම සඳහා, අවසන් ව්‍යාප්තියට අදාළ දළ සැකැස්මක් චිත්‍ර අඳින කඩදාසිය මත පැන්සල් රේඛාවෙන් සැලසුම් කරන්න.

## ඉඟිය 02

**සැරසිලි ඒකක ව්‍යාප්ත කළ හැකි ක්‍රම**







## පියවර 02

- ඔබ විසින් රැගෙන ආ ද්‍රව්‍ය සහ උපකරණ භාවිතයෙන් ඔබ සැලසුම් කරන ලද ව්‍යාප්ත සැරසිල්ල රෙදි කැබැල්ල මත මුද්‍රණය කිරීමට සුදුසු පරිදි තලය සකස් කර ගන්න.
- ඒ සඳහා පහත රූප සටහන ආදර්ශයට ගන්න.






## ඉඟිය 03

අප භාවිත කරන වර්ණ මාධ්‍යය එකිනෙකට වෙනස් ගුණාංගවලින් යුක්ත වන අතර, ඒවායේ ගුණ අනුව විවිධ කාර්යයන් සඳහා භාවිත කළ හැකි ය.

### රෙදි පින්තාරු තීන්තවල (Fabric paints) ගුණාංග

- ඝන මාධ්‍යයකි.
- විනිවිද පෙනීමක් නැත.
- රෙදි පින්තාරු කිරීමට හා මුද්‍රණ කටයුතු සඳහා වඩාත් සුදුසු ය.





## පියවර 03

- රෙදි පින්තාරු වර්ණ කිහිපයක් පිඟානකට හෝ දීසියකට දමන්න.
- පින්සලෙන් හෝ ස්පොන්ජ් කැබැල්ලෙන් ශාක පත්‍රයේ යටි පැත්තේ වර්ණ තවරන්න.

- ව්‍යාප්තිය සඳහා ඔබ ඇඳ ගත් දළ සටහනට අනුව වර්ණ තැවරූ ශාක පත්‍රය රෙදි කැබැල්ලෙහි අදාළ ස්ථානයේ තබා අත්ලෙන් තද කොට මුද්‍රණය කර ශාක පත්‍රය ඉවත් කරන්න. නැවත ශාක පත්‍රයේ වර්ණ ගන්වා මුද්‍රණය කරන්න. ඔබට අභිමත පරිදි වර්ණ ගැළපීම කරන්න.
- ඉහත ආකාරයට ව්‍යාප්ත සැරසිල්ල සම්පූර්ණ කළ පසු මුද්‍රිත රෙදි කැබැල්ල වියළෙන්නට තබන්න.

## පියවර 04

- ඔබ භාවිතයට ගත් උපකරණ පිරිසුදු කොට නියමිත ස්ථානයේ තබන්න. වැඩ පරිශ්‍රය පිරිසුදු කරන්න.
- ඔබගේ නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
- ඔබේ සහ අන් අයගේ නිර්මාණ විචාරාත්මක ව අගයන්න. රස විඳින්න.




### ඉඟිය 04

ඔබ නිර්මාණය සිදු කළ රෙදි කැබැල්ල වටා බ්ලැන්කට් මැස්ම (Blanket stitch) යොදා නිමහම් කර ගන්න. ඒ සඳහා නිවසේ වැඩිහිටියකුගෙන් සහාය ලබා ගන්න. ඔබගේ නිර්මාණ වාර්ෂික නිර්මාණ ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශනය සඳහා සුරැකි ව තබා ගන්න.

**ඔබේ ගුරුතුමා/තුමිය විසින් පහත සඳහන් ප්‍රශ්න ඔබෙන් අසනු ඇත. ඒ සඳහා වාචික ව පිළිතුරු ලබා දෙන්න.**

- ඔබ කවිනයා නම් ශාක පත්‍රවල නිරීක්ෂණය කරන ලද ලක්ෂණ පහක් නම් කරන්න?
- ඔබේ නිර්මාණය කිරීමට භාවිත කළ ශිල්ප ක්‍රමය කුමක් ද?
- මෙවැනි නිර්මාණ සඳහා භාවිත කිරීමට, ස්වාභාවික පරිසරයෙන් සොයා ගත හැකි ද්‍රව්‍ය පහක් නම් කරන්න.
- අපි විසින් පරිසරය රැක ගත යුත්තේ ඇයි?
- කුඩා තොප්පි ඇණ (Drawing pins) මගින් රෙදි කැබැල්ල ලෑල්ලට සවි කිරීමේ දී මුද්‍රණ සීමාවෙන් පිටත සවි කිරීමට හේතුව කුමක් ද?
- රෙදි කැබැල්ලට යටින් ඉටිරෙදි කැබැල්ලක් යෙදීමට හේතුව කුමක් ද?.
- මෙම ශිල්ප ක්‍රමය උපයෝගී කර ගෙන ඔබට කළ හැකි නිර්මාණ 05ක් නම් කරන්න.



## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරින් ස්වයං තක්සේරුවක නිරත වන්න. එහි දී එක් එක් කාර්ය ඉටු කිරීම පිළිබඳ ව ඔබේ හැකියා මට්ටම තෝරන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| ශාක පත්‍රවල ලක්ෂණ ලියා දැක්වීමට | | | | |
| දළ සටහන් මගින් ව්‍යාප්ත සැරසිල්ලක් සැලසුම් කිරීමට | | | | |
| කාර්යයට උචිත ද්‍රව්‍ය සහ උපකරණ භාවිතයට | | | | |
| අච්චු මුද්‍රණය පිළිබඳ අවබෝධයෙන් නිර්මාණයට උචිත වර්ණ හා හැඩතල සංයමයෙන් යුතු ව ගැළපීමට | | | | |
| ව්‍යාප්ත මෝස්තරයක තිබිය යුතු මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් උචිත හැඩතල සහ වර්ණ භාවිත කර නිර්මාණය කිරීමට | | | | |
| නිර්මාණ ඉදිරිපත් කිරීමට හා අගය කිරීමට | | | | |

# 02

# ළමා පොතකට නමක් අඳිමු



කාලච්ඡේද 02යි

## හැඳින්වීම

මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට නිර්මාණාත්මක ව අක්ෂර ඇඳීමට අවස්ථාව ලැබේ. එහි දී විවිධ අක්ෂර වර්ග භාවිතයෙන් ළමා කතන්දර පොතකට සුදුසු නමක් ඇඳීම සිදු කෙරේ. නිර්මාණාත්මක ව රේඛා, හැඩතල සහ වර්ණ ගළපමින් මෙම ක්‍රියාකාරකමේ නිරත වීමට අවශ්‍ය මඟ පෙන්වීම ලැබෙන අතර අක්ෂර භාවිතයෙන් සිදු කරන ඕනෑ ම නිර්මාණ කාර්යක් සඳහා මෙවැනි ක්‍රියාකාරකම් මගින් ලබන කුසලතා උපයෝගී කරගත හැකි ය.

## මෙම ක්‍රියාකාරකම මගින්,

- පූර්ව ඉගෙනුම් අද්දැකීම් ආදේශ කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කිරීම
- අක්ෂර ලිවීමේ දී අනුගමනය කළ යුතු මූලික රීති භාවිතයෙන් අක්ෂර ලිවීම
- කතන්දර පොතකට නමක් නිර්මාණාත්මක ව සුදුසු අක්ෂර හැඩ ඇසුරෙන් සැලසුම් කිරීම
- රේඛා, හැඩ සහ වර්ණ තෝරා ගනිමින් ඇඳීම
- චිත්‍ර, පොතේ නම, කර්තෘගේ නම ඇතුළත් වන සේ කතන්දර පොතේ මුල් පිටුවක් නිර්මාණාත්මක ව සැලසුම් කිරීම
- නිර්මාණ ප්‍රදර්ශනය, ඇගයීම හා රසවින්දනය,

යන හැකියා ඔබට ලැබෙනු ඇත.

### අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ

- A4 කඩදාසි 02ක්
- ළමා කතන්දර පොතක පිට කවරයකට සුදුසු චිත්‍රයක් ( A4 භාගයක ප්‍රමාණය)
- A4 ප්‍රමාණයේ පිටපත් කිරීමේ (ට්‍රේසින්/ටිෂූ) කඩදාසි
- ළමා කතන්දර පොත් කිහිපයක්
- පුවත්පත් සඟරා පිටු කිහිපයක්
- පාට පැන්සල්, ප්ලැටිග්නම්, පාට පෑන්, හෝ අක්ෂර ඇඳීම සඳහා වෙනත් සුදුසු මාධ්‍යය

## පියවර 01

- **අක්ෂරකරණය පිළිබඳ ඔබේ පෙර දැනුම විමසා බලන්න.**
- දුවේ පුතේ, ප්‍රාථමික ශ්‍රේණිවල දී ගුරුතුමිය ඔබට අකුරු ලියන්නට හුරු කළා මතක ඇති. පස්රූල් පොතක අක්ෂර ලිවීම ගුරුතුමිය ඉගැන්වූ ආකාරය සිහිපත් කරන්න. එම කුසලතාව භාවිත කර පස් රූලක් ඔබගේ චිත්‍ර පොතෙහි සටහන් කර ගෙන ඒ මත ඔබගේ නම ලියන්න.

### ඉඟිය 01

**පස් රූලක මිමි පහතින් දැක්වේ.**






## පිලි රහිත සිංහල අක්ෂර පස්රූල තුළ ස්ථානගත කරන ආකරය (අක්ෂර ලිවීමේ රීති) අනුව කාණ්ඩ තුනකි.

- 2 හා 4 රේඛා ස්පර්ශ වන ලෙස ලිවිය යුතු අක්ෂර **මධ්‍ය** අක්ෂර ලෙස හැඳින්වේ.
- 2 හා 5 රේඛා ස්පර්ශ වන ලෙස ලියැවෙන අක්ෂර **අවරෝහණ** (පහළට යන) අක්ෂර ලෙසත්,
- 1 හා 4 රේඛා ස්පර්ශ වන ලෙස ලියැවෙන අක්ෂර **ආරෝහණ** (ඉහළට යන) අක්ෂර ලෙසත්, හැඳින්වේ.




## අක්ෂර ලිවීම හා අක්ෂර ඇඳීම අතර වෙනස හඳුනා ගනිමු

- ලිඛිත ව අදහස් සන්නිවේදනය කිරීමට අක්ෂර හෙවත් අකුරු භාවිත කරනු ලබයි.
- භාෂාවක ඇති අක්ෂර දෘශ්‍ය සන්නිවේදන මාධ්‍යයකි.
- අක්ෂර යොදා ගෙන සිදු කරන සන්නිවේදනයේ දී පාඨකයාගේ (කියවන්නාගේ) ආකර්ෂණය හා අවධානය ලබා ගැනීමට නොයෙක් උපක්‍රම භාවිත කරනු ලැබේ. සඟරා, පුවත් පත් පිටුවල අක්ෂර භාවිත කර ඇති ආකාරය බලන්න.
- අක්ෂරවල මූලික ගුණ ආරක්ෂා කර ගනිමින් නිර්මාණශීලී ව අක්ෂර ඉදිරිපත් කිරීම එක් උපක්‍රමයකි.
- දෘශ්‍ය ආකර්ෂණය ලබා ගැනීමත්, අවධානය ලබා ගැනීමත්, ඒකාකාරී අක්ෂර රටාවකින් සිදු කළ නොහැකි ය.
- අක්ෂර විවිධ වෙනස්කම් සිදු කරමින් කලාත්මක ව හා නිර්මාණශීලී ව ඉදිරිපත් කළ හැකි ය. එය සාමාන්‍ය අක්ෂර ලිවීමට වඩා නිර්මාණශීලී කාර්යයකි.

- **දුවේ පුතේ, චිත්තාකර්ෂණීය ලෙස අක්ෂර හැඩ ගන්වමින් නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම අක්ෂර ඇඳීම ලෙස හැඳින් වේ.**

## පියවර 02

# නිර්මාණාත්මක අක්ෂර අඳිමු

- ඔබගේ චිත්‍ර පොතෙහි ඔබ කැමති අක්ෂරයක් පහත උපදෙස් අනුගමනය කරමින් නිර්මාණාත්මක ව අඳින්න.
  - අක්ෂර ලිවීමේ මූලික රීතිවලට අනුගත ව අක්ෂර අඳින්න.
  - මෙහි දී සමාන සහ අසමාන ඝනකමින් යුතු ව සහ නිර්මාණාත්මක ව හැඩගන්වා අක්ෂරය ඇඳීමට ඔබට හැකි ය.
  - ඔබ ඇඳි අක්ෂරය මිතුරන් ඇඳි අක්ෂර සමඟ සංසන්දනය කරමින් අඩුපාඩු නිවැරදි කර ගන්න.
  - ඔබ අඳින ලද අක්ෂරය ත්‍රිමාන අක්ෂරයක් ලෙස හැඩ ගැන්වීමට උත්සාහ කරන්න. මෙහි දී ඔබ මීට පෙර ද්‍රව්‍ය බලා ඇඳීම ක්‍රියාකාරකමේ දී ලබා ගත් කුසලතා භාවිතට ගන්න. අක්ෂරය වර්ණ ගන්වන්න.

### ඉඟිය 02

ඕනෑ ම අක්ෂරයක් විවිධාකාරයෙන් හැඩ ගන්වන්න පුළුවන්



## පියවර 03

**ඔබ සහ ඔබේ යහළුවන් විසින් පන්තියට රැගෙන ආ ළමා කතන්දර පොත් පිට කවර පහත කරුණු ඔස්සේ හොඳින් අධ්‍යයනය කරන්න.**

- තේමාවට උචිත අක්ෂර හැඩ හා වර්ණ භාවිතය
- රූප හා අක්ෂර පිටුවට ගැළපීම
- ආකර්ෂණීය බව
- නිර්මාණශීලී බව
- වෙනත් විශේෂ ලක්ෂණ










**දුවේ පුතේ,**

ඕනෑ ම කාර්යයක් කිරීමට පෙර එය හොඳින් සැලසුම් කළ යුතු ය.

එසේ නොකළහොත් අප බලාපොරොත්තු වන අවසන් ප්‍රතිඵලය ලබා ගැනීමට නොහැකි වෙයි.

සාර්ථක අවසන් ප්‍රතිඵලයක් ලබා ගැනීමට මනා ලෙස සැලසුම් කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

## පියවර 04

### ළමා කතන්දර පොතක පිටකවරයේ මුල් පිටුව (Front cover) සැලසුම් කරමු

පහත කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරමින් පිටකවරය සඳහා චිත්‍ර අඳින කඩදාසි තලය මනාව සැලසුම් කරගන්න.

- කතන්දර පොතේ නම ලිවීමට ඉඩක් වෙන් කිරීම
- චිත්‍රය ඇතුළත් විය යුතු සීමාව සලකුණු කර ගැනීම
- කතුවරයාගේ නම ලිවීමට ඉඩක් වෙන් කිරීම

**ඉඟිය 03**

**ඔබේ නිර්මාණශීලීත්වය මත මුල් පිටුව සඳහා විවිධ සැලසුම් යොදා ගත හැකි ය.**



පිටකවරයේ සැලැස්ම සකස් කර ගැනීමෙන් පසු චිත්‍රය ඇලවිය යුතු සීමාවේ ඔබ රැගෙන ආ චිත්‍රය සුදුසු පරිදි ප්‍රමාණාත්මක ව සකස් කර අලවා ගන්න.

- කතන්දර පොත සඳහා සුදුසු නමක් යෝජනා කරන්න. (අලවා ගත් චිත්‍රයේ ඇති රූප හැඩතලවලට සුදුසු නමක් විය යුතු ය).
- පිටකවරයේ නම ලිවීම සඳහා වෙන් කළ ඉඩට ගැළපෙන ලෙස වෙනත් කඩදාසියක් මත යෝජිත නම නිර්මාණාත්මක ව දළ සටහන් අඳිමින් සැලසුම් කරන්න.

- දළ සටහන් අතුරින් තෝරා ගත් නම වෙනත් කඩදාසියක් මත පැහැදිලි ව අඳින්න.
- කතන්දර පොතේ නම ට්‍රේසින් කඩදාසියක් මගින් පිටකවරයට පිටපත් කරන්න.
- පිරිසුදු මනා නිමාවක් ලැබෙන පරිදි පාට පැන්සල් හෝ වෙනත් ඇඳීමේ මාධ්‍ය භාවිතයෙන් සුදුසු වර්ණ, රේඛා යොදා නම වර්ණ ගන්වන්න.
- පොතේ කතුවරයා ඔබ යැයි සිතා ඒ සඳහා වෙන් කළ සීමාවේ ඔබේ නම ද නිර්මාණාත්මක ව ඇතුළත් කරන්න.
- පිට කවරයේ චිත්‍රය, අක්ෂර සමග එකිනෙකට ගැළපෙන ලෙස පසුබිම වර්ණ කරන්න.
- ඔබේ නිර්මාණය පන්තියේ ප්‍රදර්ශනය කර වාචික ව ඉදිරිපත් කිරීමක් කරන්න.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරින් ස්වයං තක්සේරුවක නිරත වන්න. එහි දී එක් එක් කාර්ය ඉටු කිරීම පිළිබඳ ව ඔබේ හැකියා මට්ටම තෝරන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| පෙර දැනුම භාවිත කිරීමට | | | | |
| අක්ෂර ලිවීමේ මූලික රීති අනුව නිවැරදි ව අක්ෂර ලිවීමට හා නිර්මාණාත්මක අක්ෂර ඇඳීමට | | | | |
| කාර්යයට උචිත අක්ෂර නිර්මාණාත්මක ව සැලසුම් කිරීමට | | | | |
| නිර්මාණකරණයේ දී උචිත රේඛා, හැඩ හා වර්ණ තෝරා ගැනීමට | | | | |
| චිත්‍ර අඳින කඩදාසිය/තලය නිර්මාණාත්මක ව භාවිත කිරීමට | | | | |
| නිර්මාණාත්මක අක්ෂර සහිත පිටකවරයක් නිර්මාණය කිරීමට | | | | |

# 03
# සුබ පැතුම් පතක් නිමවමු

කාලච්ඡේද 02යි




## හැඳින්වීම

මෙම ක්‍රියාකාරකමෙහි නිරතවීමෙන් සරල අච්චු මුද්‍රණ ක්‍රමය භාවිතයෙන් සුබ පැතුම් පතක් නිර්මාණ කිරීමට අවස්ථාව හිමි වේ. එහි දී සැලසුම් කිරීම, ස්වාභාවික ද්‍රව්‍ය, රේඛා, හැඩ සහ වර්ණ මාධ්‍ය උචිත ලෙස නිර්මාණ සඳහා භාවිත කිරීමට හැකියාව ලැබේ. මෙම ක්‍රියාකාරකමේ නිරත වීමෙන් ලබන කුසලතා එදිනෙදා ජීවිතයේ විවිධ අවශ්‍යතාවල දී ද භාවිතයට ගැනීමට ඔබට හැකි ය.

## මෙම ක්‍රියාකාරකම මගින්,

- පෙර සූදානමකින් යුතු ව කටයුතු කිරීම
- සරල මුද්‍රණ සඳහා භාවිත කළ හැකි අමුද්‍රව්‍ය, හැඩතල හා මාධ්‍ය අවබෝධයෙන් තෝරා ගැනීම
- මුද්‍රණයට සුදුසු වර්ණ මාධ්‍ය හා උචිත හැඩ යොදා ගෙන සුබ පැතුම් පතක් සැලසුම් කිරීම
- සැලසුම් මූලිකාංග හා උචිත මූලධර්ම භාවිතයෙන් නිර්මාණ කිරීම
- අවශ්‍යතාවලට උචිත පරිදි සරල අච්චු මුද්‍රණ ක්‍රමය නිවැරදි ව භාවිත කිරීම
- නිර්මාණ අගය කිරීමට හා රස විඳීම,

යන හැකියා ඔබට ලැබෙනු ඇත.

## අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

- වර්ණ මාධ්‍ය - දියසායම්/රෙදි පින්තාරු තීන්ත/ඇක්‍රලික් තීන්ත/පෝස්ටර් වර්ණ/බැනර් පේන්ට්
- බැලුම් බෝල 2ක්
- අඟල් 6X6 පමණ ගෝනි කැබැල්ලක්
- විවිධ මතුපිට ස්වභාවයන් සහිත ගස්වල පොතු කැබලි කිහිපයක් (කැබැල්ලක ප්‍රමාණය අඟල් 3X3 පමණ)
- විවිධ හැඩ සහිත ගස්වල කොළ කිහිපයක්
- මකන කැල්ලක්
- සරල අච්චු ලෙස භාවිත කළ හැකි අමුද්‍රව්‍ය කිහිපයක් (අර්තාපල්, කැරට්, බීට්රූට් අල වැනි)
- පේපර් කටරයක්
- පීරිසි 2ක්
- A4 ප්‍රමාණයේ සුදු බ්‍රිස්ල් බෝඩ් කැබලි 2ක්
- අඟල් 4X4 ප්‍රමාණයේ ඝනකම් කාඩ්බෝඩ් කැබැල්ලක්
- අඟල් 3X3 ප්‍රමාණයේ ස්පොන්ජ් කැබැල්ලක්

## පෙර සූදානම සඳහා ක්‍රියාකාරකම්



එදින වර්ෂාව සහිත දවසක්. විදෙව් පාසල ඇරී නිවසට පැමිණියේ හොඳට ම තෙමීගෙන ය. පොත් බෑගය ප්‍රවේශමෙන් ගළවා ඉවත් කළ විදෙව්, තෙත රෙදි පිටින් ම නිවස තුළට පැමිණියේ ය. එය දුටු අම්මා ''පුතේ කකුල් දෙකේ වතුරවලින් ගේ තෙමෙනවා. පා පිස්සෙන් කකුල පිහදා ගෙන එන්න'' යැයි ප්‍රකාශ කළා ය.

විදෙව් ගමන නවතා පිටුපසට හැරී බිම බැලුවේ ය. ඔහු පැමිණි මාර්ගයේ තමන්ගේ පා සළකුණු ඒ අයුරින් ම සටහන් ව ඇති බව දුටුවේ ය.

ආපසු හැරුණු විදෙව් කොරිඩෝවේ වැටී තිබුණු වතුර මත පාදය තබමින් කොරිඩෝවේ පා සළකුණු තබමින් රටාවක් නිර්මාණය කළේ ය. අනතුරු ව මිදුල දෙස බැලූ විට විදෙව්ගේ සපත්තු දෙකේ අඩි පාරවල් මුද්‍රණය වී ඇති අපූර්වත්වයත් ඔහු දුටුවේ ය. තමා ලැබූ අත්දැකීමෙන් අලංකාර නිර්මාණයක් කළ යුතු යැයි විදෙව් සිතුවේ ය.



දුවේ පුතේ,

පෙර සූදානම අවස්ථාවේ විඳෙව් ලැබූ අත්දැකීම සිහිපත් කරන්න. ඒ අනුව මුද්‍රණය පිළිබඳ සරල අදහසක් ඔබට ලබා ගැනීමට හැකි ය.

**ස්වාභාවික හෝ නිර්මිත වස්තුවක් මත වර්ණ තවරා එමගින් පිටපත් ලබා ගැනීම සරල අච්චු මුද්‍රණය ලෙස හඳුන්වනවා.**

- ඔබ විසින් රැගෙන ආ වර්ණ මාධ්‍යවලින් වර්ණ කිහිපයක් පීරිසියකට හෝ පිඟානකට දමන්න.
- පින්සලයක් හෝ ස්පොන්ජ් කැබැල්ලක් භාවිත කර ගෝනි කැබැල්ලේ මතුපිට වර්ණ කිහිපයක් තැනින් තැන ආලේප කරන්න. වර්ණ තැවරූ පැත්ත කඩදාසියක් මත තබා එහා මෙහා නොයන ලෙස අතින් තද කර මුද්‍රණය කරන්න.
- ඔබ විසින් රැගෙන ආ විවිධ හැඩයේ ගස්වල කොළ සහ පොතු කැබලි මත ද වර්ණ තවරා කඩදාසිය මත මුද්‍රණය කර බලන්න.




## ඉඟිය 01

**පළමු මොඩියුලයේ ඇතුළත් 6වන ක්‍රියාකාරකමේ දී ඔබ උගත් වර්ණ පිළිබඳ අවධානයට ගන්න. මූලික වර්ණ සහ ඒවා භාවිතයෙන් සකස් කර ගත හැකි ද්විතීයික වර්ණ මෙම ක්‍රියාකාරකමේ දී ද භාවිතයට ගන්න.**

## නැවත නැවත කිරීමෙන් උගනිමු

**පහත උපදෙස් කියවා පිළිවෙළින් ක්‍රියාකාරකම කරන්න.**

- ඔබ රැගෙන ආ බැලුම් බෝලයක් පුම්බා ගෙන හුළං නොයන ලෙස ගැටයක් යොදා ගන්න.
- වර්ණ හා පින්සල ආධාරයෙන් බැලුම් බෝලය මත ඔබේ නම ලියන්න. කඩදාසියක් මත බැලුම් බෝලය තබා නම මුද්‍රණය කරන්න.
  - ඔබේ නම නිවැරදි ව මුද්‍රණය වුවා ද?
  - ඔබේ නම නිවැරදි ව මුද්‍රණය වීමට කුමක් කළ යුතු ද?
- ඔබේ නම නිවැරදි ව මුද්‍රණය කර ගැනීමට බැලුනය මත නම ලිවිය යුතු ආකාරය චිත්‍ර පොතේ ලියන්න.
- නැවත බැලුනය මත නම ලියා නිවැරදි ව මුද්‍රණය කරන්න.



# උපන් දින සුබ පැතුමක්

### පියවර 01

## උපන් දින සුබ පැතුම් පතක් නිර්මාණය කරමු

සරල අච්චු මුද්‍රණය මගින් උපන් දින සුබ පැතුම් පතක් සැරසිලි කිරීමට සුදුසු හැඩතල ඔබ විසින් රැගෙන ආ ස්වාභාවික හා නිර්මිත ද්‍රව්‍යවලින් තෝරා ඒවා සකස් කර ගන්නා ආකාරය පිළිබඳ ව ඔබේ යහළුවන් සමග සාකච්ඡා කරන්න.

**උපන් දින සුබ පැතුම් පතකට සැලසුමක් සකස් කර ගන්න.**





## පියවර 02

- ඔබේ සැලසුමට අනුව, පෙර සූදානමේ දී ඔබ කළ ක්‍රියාකාරකම් ඇසුරු කර ගනිමින් සුදු පැහැති A4 ප්‍රමාණයේ බ්‍රිස්ල් බෝඩ් එක මත අලංකාර පසුබිමක් නිර්මාණය කරන්න.
- සුබ පැතුම් පත සඳහා ඔබ සැලසුම් කළ හැඩතල අතරින් තෝරා ගත් හැඩතල කිහිපයක්, රැගෙන එන ලද එළවළුවලින් කැටයම් කර සරල මුද්‍රණ අච්චු කිහිපයක් සකස් කර ගන්න.
- උපකරණ භාවිතයේ දී සැම විට ම ප්‍රවේශම හා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න.










## පියවර 03

- ඔබ සකස් කළ අච්චු හා තෝරා ගත් ස්වාභාවික ද්‍රව්‍ය භාවිතයෙන් සරල මුද්‍රණ ශිල්ප ක්‍රමයට අනුව අලංකාර සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.
- අක්ෂර යෙදීම සඳහා ඝනකම සහිත කාඩ්බෝඩ් කැබැල්ල හෝ හුළං පිර වූ බැලුනය භාවිත කරන්න.

## ඉඟිය 02

අච්චු මත හා ස්වාභාවික ද්‍රව්‍ය මත වර්ණ තැවරීමේ දී ජලය හැකිතාක් අඩුවෙන් භාවිත කරන්න. වර්ණ ඝන ව භාවිත කිරීමෙන් මුද්‍රණය ඉතා විධිමත් ව ලබා ගැනීමට හැකි ය.

## පියවර 04

- ඔබ භාවිතයට ගත් උපකරණ පිරිසුදු කොට නියමිත ස්ථානයෙන් තබන්න. වැඩ පරිශ්‍රය පිරිසිදු කරන්න.
- ඔබගේ නිර්මාණය ඉදිරිපත් කරන්න. ඔබගේ මෙන් ම අන් අයගේ නිර්මාණ ද විචාරාත්මක ව අගයන්න.




- ඔබගේ නිර්මාණ පාසල් නිර්මාණ පුවරුවේ හෝ පන්තිකාමර නිර්මාණ පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- වාර්ෂික නිර්මාණ ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශනය සඳහා ඔබගේ නිර්මාණ සුරැකි ව තබා ගන්න.

### ඉඟිය 03

මෙවැනි නිර්මාණ විවිධ උත්සව අවස්ථා හා සැමරුම් සඳහා ඔබේ ගුරුවරුන්ට, නෑදෑ හිතවතුන්ට, යහළුවන්ට ආදී සියලු දෙනාට සුබ පැතීමට භාවිත කිරීමට හැකි ය. මෙවැනි අලංකාර, නිර්මාණශීලී සුබ පැතුම් පත් සඳහා වෙළෙඳ පොළේ ඉහළ ඉල්ලුමක් ද පවතී.






**පහත සඳහන් ප්‍රශ්න මිතුරන්ගෙන් විමසමින් පිළිතුරු සාකච්ඡා කරන්න.**

01. අච්චු මුද්‍රණය මගින් වර්ණ චිත්‍රයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය නම්, ඒ සඳහා තෝරා ගත හැකි වඩාත් සුදුසු වර්ණ මාධ්‍ය 2ක් නම් කරන්න.
02. අලංකාර අච්චු නිර්මාණය කර ගැනීමට භාවිත කළ හැකි ස්වාභාවික අමු ද්‍රව්‍ය 5ක් නම් කරන්න.
03. සරල අච්චු මුද්‍රණය සඳහා භාවිත කළ හැකි නිර්මිත වස්තු 03ක් නම් කරන්න.
04. සරල අච්චු මුද්‍රණයෙන් කරන නිර්මාණ එදිනෙදා ජීවිතයේ භාවිතයට ගත හැකි අවස්ථා 3ක් සඳහන් කරන්න.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරින් ස්වයං තක්සේරුවක නිරත වන්න. එහි දී එක් එක් කාර්ය ඉටු කිරීම පිළිබඳ ව ඔබේ හැකියා මට්ටම තෝරන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| පෙර සූදානමට අදාළ ක්‍රියාකාරකම් කිරීමට | | | | |
| විවිධ අමුද්‍රව්‍ය හා වර්ණ මාධ්‍ය පිළිබඳ අවබෝධයෙන් නිර්මාණ කිරීමට | | | | |
| සරල අච්චු මුද්‍රණ නිර්මාණ භාවිත කළ හැකි අවස්ථා නම් කිරීමට | | | | |
| සරල අච්චු මුද්‍රණ ක්‍රමවේදයට උචිත රේඛා, හැඩතල හා වර්ණ භාවිත කිරීමට | | | | |
| නිර්මාණ ඉදිරිපත් කිරීමට හා ඇගයීමට | | | | |

# 04
# මිනිස් රුවක් සරල ව අඹමු

කාලච්ඡේද 02යි



## හැඳින්වීම

ඔබට මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ස්වාභාවික මැටි මාධ්‍ය භාවිතයෙන් මානව රුවක් සරල ව නිර්මාණය කිරීමට හැකියාව ලැබෙයි. කඩදාසියක් මත වර්ණ, රේඛා හැඩ භාවිතයෙන් මතු කරන ත්‍රිමාන රූපී බව මූර්ති නිර්මාණයක් මගින් සජීවී ව, ප්‍රායෝගික ව, සමීප ව අත් විඳීමට ද හැකිවනු ඇත.

### මෙම ක්‍රියාකාරකම මගින්,

- මැටි භාවිතයෙන් මානව රූපයක මූර්තියක් නිර්මාණයට දළ සටහන් ඇඳීම
- ඉතා සරල ව මානව රූපයක මූලික හැඩය මූර්තියක් මගින් නිර්මාණය කිරීම
- ශිල්ප ක්‍රම හා උපකරණ උචිත පරිදි නිවැරදි ව භාවිත කිරීම
- මානව රූපයේ අංග සංවිධානාත්මක ව ත්‍රිමාණ බව මතු වන සේ සංයමයෙන් ඇඹීම
- ආත්ම විශ්වාසයෙන් යුතු ව ප්‍රශ්නවලට පිළිතුරු දීම, සබකෝලයෙන් තොර ව නිර්මාණ ඉදිරිපත් කිරීම, අන් අයගේ නිර්මාණ ඇගයීම හා රස විඳීම,

යන හැකියා ඔබට ලැබෙනු ඇත.

## අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ



- පදම් කළ ස්වාභාවික මැටි
- මේසයක් මත තබා ගත හැකි ලී ආධාරකයක් (ලෑල්ලක් 30cm x 15cm පමණ)
- ඇඹීමේ උපකරණ (Tools) - ලී පතුරු, පොප්සිකල් කෝටු, යෝගට් හැඳි, බයින්ඩිං කම්බි කෑල්ලක්, කියත් පටිවලින් සාදා ගත් උපකරණ හෝ වෙළෙඳ පොළෙන් මිල දී ගත් උපකරණ
- පොලිතීන් කැබැල්ලක්
- පින්සලයක්
- A4 කඩදාසි 3ක් පමණ
- ජලය
- පැන්සලක්
- ඒප්‍රනයක්
- ජලය දැමීමට කුඩා භාජනයක්

## පෙර සූදානම සඳහා ක්‍රියාකාරකම

ආදරණීය දුවේ පුතේ,

පන්තිකාමර ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුභවතාගේ උපදෙස් පරිදි පහත ක්‍රියාකාරකම ඔබ විසින් සම්පූර්ණ කර, නියමිත දිනයේ දී එම දළ සටහන් සමග පන්තියට පැමිණෙන්න.



- මානව රුවක සරල මූර්තියක් නිර්මාණය කිරීම සඳහා ත්‍රිමාන ජ්‍යාමිතික හැඩ භාවිතයෙන් මානව රුවක දළ සටහන් අඳින්න.
- එහි දී මොඩියුලය I හි ඇතුළත් ද්‍රව්‍ය බලා ඇඳීම සහ මානව රූප ඇඳීමේ ක්‍රියාකාරකම්වල දී ඔබ ලැබූ හැකියා භාවිත කරන්න.
- මානව රුවේ විවිධ ඉරියව් කිහිපයක දළ සටහන් අඳින්න.
- පැන්සල් රේඛාව භාවිතයෙන් ඔබේ දළ සටහන්, එළිය අඳුර දක්වමින් ත්‍රිමාන රූප බවට පත් කරන්න.

## ඉඟිය 01

මූර්තියක් නිර්මාණය කිරීමට පෙර එහි දළ සටහන් ඇඳීම ඉතා වැදගත් ය. එමගින් නිර්මාණය හොඳින් සංවිධානය කර ගත හැකි ය.

එමෙන් ම නිර්මාණය පිළිබඳ පූර්ව අදහසක් ඇති ව, අඩු පාඩු අව ම වන පරිදි කටයුතු කිරීමට ද හැකි වේ.



## පියවර 01

- ඔබ නිවසේ දී අඳින ලද දළ සටහන් පන්තියේ අනෙකුත් සාමාජිකයන්ගේ දළ සටහන් සමග සසඳමින් සාකච්ඡා කරන්න.
- ගුරු උපදෙස් මත දළ සටහන්වල අඩුපාඩු සකස් කර ගෙන ඒ අතුරින් එක් රූපයක් මූර්ති නිර්මාණය සඳහා තෝරා ගන්න.
- ඔබ විසින් මූර්තිය ඇඹීමට පෙර පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

**ඔබ සාදන මානව රුවේ උස ප්‍රමාණය අඟල් 6ක් පමණ වීම.**

**මූර්තිය ඇඹීමේ දී මානව රුවේ අත් සහ පාද ආදියේ පිටතට විහිදීම් අවම වීම, නැතහොත් කැඩී යා හැකි බැවිනි.**

**මානව රූපයේ මූලික අංග හා ශරීරයේ නැමුම් ස්ථාන මතු කිරීමෙන් ත්‍රිමාන බව වඩාත් හොඳින් දැක්වීම.**

## ඉඟිය 02

මානව ශරීරයේ මූලිකාංග සහ ප්‍රධාන නැමුම් ස්ථාන




## පියවර 02

- ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙර ඒප්‍රනය පැළඳ ගන්න.
- සපයා ගත් පදම් කළ මැටි මිතුරන් අතර බෙදා ගන්න. අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ සූදානම් කර ගන්න.
- ඔබ රැගෙන ආ ආධාරක ලෑල්ලෙහි පැතලි පෘෂ්ඨය මත පොලිතින් කොළය එළා සකසා ගන්න.
- ඔබ තෝරා ගන්නා ලද දළ සටහනට අනුව පදම් කළ මැටි භාවිතයෙන් මිනිස් රුවක් ඇඹීම ආරම්භ කරන්න.



- ශරීරයේ ප්‍රධාන කොටස් මතුකර ඉන් පසු ව කුඩා මැටි කොටස් එකිනෙක තබමින් පියවරෙන් පියවර මූර්තියේ අනෙකුත් අංග ගොඩනගන්න.
- මානව රුවේ ඇතුළට ගිලී ගිය තැන් සහ ඉහළට මතු වූ තැන් පිළිබඳ අවධානය යොමු කරමින් ත්‍රිමාන ස්වභාවය මතු කරන්න.



- එකතු කරන මැටි කොටස් උපකරණ භාවිතයෙන් තෙරපමින් හොඳින් සම්බන්ධ කර මූර්තිය නිර්මාණය කරන්න.

**කිසියම් හැඩයක් හෝ රූපයක් මැටි කොටස් එකතු කරමින් පියවරෙන් පියවර මතු කර ගැනීම ඇඹීම යනුවෙන් හඳුන්වයි. දෑතේ ඇඟිලි හා උපකරණ හසුරුවා තෙරපවමින්, ගුලි කරමින්, යනාදී විවිධ ශිල්ප ක්‍රම මගින් ඇඹීම සිදු කරයි.**

- සුදුසු උපකරණ භාවිතයෙන් ඔබේ කැමැත්ත පරිදි මූර්තිය මත වයනයක් (මතුපිට ස්වභාවයක්) යෙදීමට ද හැකි ය.

## පියවර 03

- සුදුසු පාදමක් (base) මැටි හෝ ලී කෑල්ලක් හෝ මත මූර්තිය තබා අලංකාරය හා වටිනාකමක් එක් කර ගන්න.
- ඔබ භාවිතයට ගත් උපකරණ පිරිසුදු කර නියමිත ස්ථානයෙහි තබන්න.
- පන්තියේ සියලු දෙනා ම එකතු වී වැඩ පරිශ්‍රය පිරිසුදු කරන්න.
- ඔබගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කර නිර්මාණය පිළිබඳ සහ ක්‍රියාකාරකම මගින් ලද අද්දැකීම් අනුසාරයෙන් අදහස් ප්‍රකාශ කරන්න.



### ජීවිතයට යමක්...

**ආදරණීය දුවේ, පුතේ,**

**පුද්ගලයෙකුගේ ජීවිතයට පිළිවෙළ සහ පිරිසුදුකම ඉතා ම වැදගත්. ඔබ විසින් භාවිත කරන ලද උපකරණ පිරිසුදු කොට ලබාගත් ස්ථානයේ ම නැවත පිළිවෙළට තබන්න.**



### වැඩ පරිශ්‍රය පිරිසුදු ව තබා ගන්න

**අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඔබේ මිතුරන් සමග සාකච්ඡා කරන්න. ගැටලු ඇත්නම් ගුරුවරයාගෙන් අසා දැනගන්න.**

01. මානව රුවක් සරල ව ඇඳීම සඳහා භාවිත කළ හැකි ජ්‍යාමිතික හැඩ මොනවා ද?

02. පදම් කරන ලද මැටි භාවිතයේ දී ඔබ හඳුනා ගත් ලක්ෂණ තුනක් නම් කරන්න.

03. මූර්තිය නිර්මාණයේ දී ඔබට මතු වූ ගැටලුවක් සහ ඊට යෙදූ පිළියමක් ඉදිරිපත් කරන්න.

04. මෙම ක්‍රියාකාරකමෙන් ලද අද්දැකීම් ඇසුරෙන් කළ හැකි වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න.

05. පාසලේ වාර්ෂික ප්‍රදර්ශනය සඳහා මැටි මාධ්‍යයෙන් තැනූ මූර්තියක් ඉදිරිපත් කරන්නේ නම්, එය නොකැඩී කල් තබා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

06. මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබ ජීවිතයට ළඟා කර ගත් යහ පුරුදු දෙකක් ප්‍රකාශ කරන්න.

## ඉඟිය 03

**මැටියෙන් නිර්මාණය කළ මූර්තියක් පවනේ වියළා, ඉන් පසු ව පුළුස්සා ගැනීමෙන් දීර්ඝ කාලයක් තබා ගත හැකි වේ. ඔබේ අවශ්‍යතාව මත රෙදි පින්තාරු තීන්ත හෝ ඇක්‍රිලික් වැනි වර්ණ භාවිතයෙන් මූර්තිය වර්ණ ගන්වා අලංකාර කළ හැකි ය.**



## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරින් ස්වයං තක්සේරුවක නිරත වන්න. එහි දී එක් එක් කාර්ය ඉටු කිරීම පිළිබඳ ව ඔබේ හැකියා මට්ටම තෝරන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| මැටියෙන් මූර්තියක් නිර්මාණයට උචිත දළ සටහන් ඇඳීමට, ශිල්ප ක්‍රම සහ උපකරණ භාවිත කිරීමට | | | | |
| මානව රූපයක මූලික හැඩය සරල ව මූර්තියක් මගින් නිර්මාණයට | | | | |
| සංයමයෙන් යුතු ව ඇඹීමේ සිද්ධාන්ත භාවිතයෙන් මිනිස් රුවක අංග ත්‍රිමාණ ව මතු කිරීමට | | | | |
| ක්‍රියාකාරකම් ඇසුරෙන් ලද අත්දැකීමෙන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට | | | | |
| නිර්මාණ ඉදිරිපත් කිරීමට හා අගය කිරීමට | | | | |



මැටි පිඩක රූ වරුණා









# 05
# සත්ත්ව රුවක් සරල ව අඹමු

කාලච්ඡේද 02යි

## හැඳින්වීම

සරල හැඩතල සහිත සත්ත්ව රුවක් මැටි භාවිතයෙන් මූර්තිමත් කිරීමට මෙම ක්‍රියාකරකමේ දී ඔබට හැකියාව ලැබෙනු ඇත. සරල ජ්‍යාමිතික හැඩ හෝ වෙනත් සරල හැඩ ඇසුරෙන් සත්ත්ව රුවක දළ සටහන් ඇඳ ඒ අනුව මූර්ති නිර්මාණය කිරීමට අවස්ථාව හිමි වේ. ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා මෙමගින් ලබන නිර්මාණශීලී අත්දැකීම් භාවිත කිරීමට ඔබට මග පෙන්වීම ද සිදු කෙරේ.

### මෙම ක්‍රියාකාරකම මගින්,

- මැටි භාවිතයෙන් සරල මූර්තියක් නිර්මාණයට දළ සටහන් ඇඳීම
- සත්ත්ව රුවක මූලික හැඩය ඉතා සරල ව මූර්තියක් මගින් නිර්මාණය කිරීම
- ශිල්ප ක්‍රම හා උපකරණ නිවැරදි ව භාවිත කිරීම
- සත්ත්ව රූපයේ අංග සැලසුම් සහතග  ව ත්‍රිමාන බව මතු වන සේ සංයමයෙන් ඇඹීම
- සංයමයෙන් යුතු ව කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම
- අවබෝධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු දීම, නිර්මාණ ඉදිරිපත් කිරීම, අන් අයගේ නිර්මාණ ඇගයීම හා රස විඳීම,

යන හැකියා ඔබට ලැබෙනු ඇත.

## අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

මොඩියුලය II,
ක්‍රියාකාරකම 04 හි දී භාවිතයට ගත් ද්‍රව්‍ය හා උපකරණ සියල්ලම මෙම ක්‍රියාකාරකම කිරීම සඳහා ද සපයා ගන්න.



## පෙර සූදානම සඳහා ක්‍රියාකාරකම

ආදරණීය දුවේ පුතේ,

පන්තිකාමර ක්‍රියාකාරකම ආරම්භ කිරීමට ප්‍රථම ඔබේ ගුරුගුමාගේ/තුමියගේ උපදෙස් පරිදි පහත දක්වා ඇති ක්‍රියාකාරකම් ඔබ විසින් සම්පූර්ණ කරන්න. දැනුම් දෙන දිනයේ දී එම නිරීක්ෂණ සහ නිර්මාණ පන්තියට රැගෙන යන්න.



අභිරූ පාසලෙන් දෙන ලද ගණිත විෂයයට අදාළ ජ්‍යාමිතික ක්‍රියාකාරකම නිම කරමින් සිටියේ ය. ඔහුගේ සුරතලා වූ මිකියා මේසය මතට පැන පුරු පුරු ගාමින් අභිරූගේ ඇගේ දැවටෙන්නට විය. මිකියාගේ හුරතලේ බලමින් සිටි අභිරූට තමන් ඉගෙන ගත් ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් මිකියාව ඇඳීමේ අපූරු ආසාවක් ඇති විය. ඔහු මිකියාගේ හැඩ ජ්‍යාමිතික හැඩ හා ගළපමින් අඳින්නට විය.

ඔබත් අභිරූ මෙන් ඔබ කැමති සිව්පා සතකුගේ රූපය සරල ජ්‍යාමිතික හැඩ මගින් පැන්සල් රේඛාවෙන් අඳින්න.

# සත්ත්ව හැඩැති උපැදවුම්



## පියවර 01

- පන්තියේ සියලු දෙනාගේ එකඟතාවෙන් කණ්ඩායම් 4කට බෙදෙන්න.
- කණ්ඩායම් නායකයෙකු පත් කර ගන්න.
- ඔබ විසින් නිවසේ දී සරල ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් අඳින ලද සත්ත්ව රූපය කණ්ඩායමේ සියලු දෙනාට පෙන්වන්න.
- කණ්ඩායමේ සියලු දෙනා ම අඳින ලද සත්ත්ව රූප සඳහා භාවිත කර ඇති හැඩ පිළිබඳ අදහස් හුවමාරු කර ගනිමින් සාකච්ඡාවක නිරත වන්න.
- ඔබ විසින් අඳින ලද සත්ත්ව රූපය, සරල මූර්තියක් ලෙස මැටියෙන් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වෙනස් කම් සිදු කර සැලසුම් කර ගන්න. ඒ සඳහා ගුරු උපදෙස් ලබා ගන්න.
- මොඩියුලය I හි පස්වන ක්‍රියාකාරකමේ දී සත්ත්ව රූප ඇඳීම යටතේ ඔබ ලද හැකියා මෙහි දී භාවිතයට ගන්න.

**ඉඟිය 01**

**සාර්ථක නිර්මාණයක් වෙනුවෙන්,**

**සැලසුම ඉතා වැදගත්...**





## පියවර 02

- ක්‍රියාකාරකමට පෙර ඒප්‍රනය පැළඳ ගන්න.
- අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ සූදානම් කර ගන්න.
- මූර්තිය ඇඹීමට භාවිත කරන ආධාරක ලෑල්ලේ සමතලා පෘෂ්ඨය මත පොලිතීන් කොළය එළා ගන්න.
- ඔබ ගෙන ආ පදම් කළ මැටි, කණ්ඩායමේ අය සමඟ බෙදා ගන්න.
- ඔබ අඳින ලද සැලසුමට අනුව මූර්තිය ඇඹීම ආරම්භ කරන්න. මූර්තියේ උස ප්‍රමාණය අඟල් 6ක් පමණ වීම ප්‍රමාණවත් ය.
- මැටි එකතු කරමින් පියවරෙන් පියවර සත්ත්ව රූපය සරල හැඩයක් ලෙස අඹන්න.
- සත්ත්ව රූපයේ ඉරියව්ව සහ අංග ලක්ෂණ මතු කර ගැනීමට සැලකිළිමත් වන්න.
- අත් පා නිර්මාණයේ දී පිටතට විහිදීම් අවම කරන්න.
- ඔබ අඹන සත්ත්ව රූපයේ ශරීරයේ ඇතුළට ගිය තැන් සහ පිටතට නෙරා ආ කොටස් දක්වමින් ත්‍රිමාන ව ගොඩ නගන්න.
- මූර්තියේ පරිමාණ, සමබරතාව, සෑම දිශාවෙන් ම පෙනෙන ආකාරය ගැන අවබෝධයෙන් නිර්මාණය කරන්න.






## ඉඟිය 02

**මූර්තියට කොටස් සම්බන්ධ කිරීමේ දී කොටස් දෙකක් සම්බන්ධ වන ස්ථාන පලුදු කර එම ස්ථාන ජලයෙන් පොඟවා කොටස් දෙක මදක් තෙරපා උපකරණයක් ආධාරයෙන් සම්බන්ධ කිරීම වැදගත් ය.**



**එසේ නොවුණහොත්, මූර්තිය වියළීමේ දී සම්බන්ධ කළ කොටස් ගැල වී යා හැකි ය.**

## පියවර 03





- කණ්ඩායමේ එකිනෙකා සමග අදහස් හුවමාරු කරගනිමින් කටයුතු කරන්න.
- ද්‍රව්‍ය හා උපකරණ බෙදා ගනිමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- මූර්තියේ සියුම් තැන් මතු කිරීමට සුදුසු ඇඟීමේ උපකරණ භාවිත කරන්න.
- කෝප්පයට ජලය ස්වල්පයක් ගෙන රෙදි කැබැල්ලේ හෝ ස්පොන්ජ් කැබැල්ලේ තවරා නිර්මාණය මතුපිට පිරිමදිමින් සුමට කරන්න.
- ඔබේ කැමැත්ත පරිදි සත්ත්ව මූර්තියට වයනයක් (මතුපිට ස්වභාවයක්) යොදා මූර්තියේ වැඩ අවසන් කරන්න.



## පියවර 04

- සියලු දෙනා එකතු වී වැඩබිම පිරිසුදු කරන්න.
- කණ්ඩායමේ නායකයින් විසින් සාකච්ඡා කර නිර්මාණ තැබීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගන්න. (පන්තිකාමරයේ හෝ පන්තිකාමරයෙන් පිටත).
- කණ්ඩායමේ නායකයින් සමඟ සාකච්ඡා කර ඔබ සෑදූ සත්ත්ව මූර්තිය ප්‍රදර්ශනය කරන්න.
- සියලු දෙනා ම නරඹන්න, එක් එක් කණ්ඩායමේ නිර්මාණ රස විඳින්න, අගය කරන්න. සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කරන්න.

## පියවර 05

- පහත දී ඇති වගුව ඇසුරින් ඔබ කළ ක්‍රියාකාරකම පිළිබඳ ස්වයං තක්සේරුවක නිරත වන්න. එහි දී එක් එක් කාර්ය ඉටු කිරීම පිළිබඳ ව ඔබේ හැකියා මට්ටම තෝරන්න.

| මට දැන් පුළුවන් | හැකියා මට්ටම | | | |
|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 |
| මැටියෙන් මූර්තියක් නිර්මාණයට උචිත දළ සටහන් ඇඳීමට, ශිල්ප ක්‍රම සහ උපකරණ භාවිත කිරීමට | | | | |
| සත්ත්ව රූපයක මූලික හැඩය සරල ව මූර්තියක් මගින් නිර්මාණයට | | | | |
| සංයමයෙන් යුතු ව ඇඹීමේ සිද්ධාන්ත භාවිතයෙන් සත්ත්ව රුවක අංග ත්‍රිමාන ව මතු කිරීමට | | | | |
| කණ්ඩායමක් තුළ ඉවසීමෙන්, සහයෝගයෙන් කටයුතු කිරීමට | | | | |
| නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට හා අගය කිරීමට | | | | |

## ඉඟිය 03

**විවේකය ඵලදායීව ගත කිරීමට මෙවැනි අර්ථවත් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඔබට කළ හැකියි.**

- විවිධ සත්ත්ව රූප මැටියෙන් අඹන්න. ඒවා පවනේ වියළා ගන්න. වියළුණු පසු සත්ත්ව රූපයට ගැළපෙන ලෙස වර්ණ ගන්වන්න (රෙදි පින්තාරු තීන්ත, ඇක්‍රිලික් වර්ණ, බැනර් පේන්ට්, ලැකර්, ඉමල්ෂන් වැනි වර්ණ වඩාත් සුදුසු ය).
- එසේ කරන ලද නිර්මාණ,
    - නිවසේ අලංකාරය සඳහා තැබීමට
    - හිත මිතුරන්ට තෑගි දෙන්න
    - නිර්මාණ අලෙවි කිරීමට
    - ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කිරීමට

ඔබට හැකි වනු ඇත.







## ජීවිතයට පුරුද්දක්

දුවේ පුතේ...,
මේ ගැනත් හිතන්න.

අපි හැමෝම නිදහසේ ජීවත්වීමට කැමතියි නේද? තවකෙකු කූඩු කර ලබන සතුටට වඩා නිදහසේ සිටිනවා දැක ලබන සතුට තමයි ඉතා වටින්නේ...





අප විඳින්නට අකැමැති හිරිහැර අන් අයට ද සිදු නොකිරීමට, පුංචි කාලේ ඉඳල ම අපි පුරුදු වෙන්න ඕන.

## හිතන්නට යමක්



''පරිසරය, මිනිසාට පමණක් නොව සියලු සත්ත්වයන්ට ම අයිති සම්පතකි''

දුවේ, පුතේ පොඩ්ඩක් හිතන්න...

පරිසරයේ ලස්සන රැඳිලා තියෙන්නෙත්, පරිසරයේ ජෛව ක්‍රියාකාරිත්වය ආරක්ෂා වී තිබෙන්නේත්, පරිසරයේ ජීවත් වන සතුන් සහ ගස්-වැල්-මල් නිසා නේද...

ඔබ මෙම මොඩියුලයේ කළ ක්‍රියාකාරකම් බොහෝමයකට අවශ්‍ය නිර්මාණශීලී අදහස්, සංකල්ප සපයා ගනු ලැබුවෙත් පරිසරයෙන් ම නේද...

එසේ නම්, මෙම පරිසර ක්‍රියාකාරීත්වය අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට එය ආරක්ෂා කිරීම ඔබටත් මටත් පැවරෙන වගකීමක්...

අපි වෙනුවෙන්, අපේ අනාගතය වෙනුවෙන්,

**අපි සැම එක් ව අපේ පරිසරය රැක ගනිමු**